ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்

Department of Pensions

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්

# வருடாந்த செயற்பாட்டு அறிக்கையும் கணக்கும்

# ANNUAL PERFORMANCE REPORT & ACCOUNTS

# 2015

# වාර්ෂික කාර්ය සාධාන වාර්තාව සහ ගිණුම් 2015

## පටුන


| | පිටු අංක |
|---|---|
| විවරණය | 8 - 9 |
| 1) ප්‍රතිලාභ වැටුප් ලියාපදිංචිය හා ප්‍රදානය | 10 - 14 |
| 2) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම | 14 - 19 |
| 2.1 ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය | 15 - 16 |
| 2.2 විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය | 16 - 19 |
| 3) විශ්‍රාම වැටුප් ප්‍රදාන ක්‍රියාවලිය | 19 - 20 |
| 3.1 විශ්‍රාම වැටුප් ප්‍රදානය | 20 |
| 4) ක්‍රියාපටිපාටි සංවර්ධනය | 20 - 25 |
| 4.1 ගෙවීම් කටයුතු ප්‍රවර්ධනය | 20 - 21 |
| 4.2 හිඟ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය ප්‍රතිසංවිධානය | 21 |
| 4.3 මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය මධ්‍යගත කිරීම | 21 - 22 |
| 4.4 වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතිසංවිධානය | 23 - 25 |
| 5) ක්‍රම සංවර්ධනය හා නවීකරණය | 25 -28 |
| 5.1 වැන්දඹු අනත් දරු හිමිකම් ලියාපදිංචි කිරීම | 25 |
| 5.2 වෙබ් අඩවිය නවීකරණය කිරීම | 25 -26 |
| 5.3 ලේඛනාගාර නවීකරණය | 26 |
| 5.4 විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම | 27 - 28 |
| 6) මූල්‍ය සමාලෝචනය | 28 -29 |
| 7) සත්කාර පියස | 29 - 30 |
| 8) විශ්‍රාම ගුවන් විදුලිය | 31 |
| 9) විශ්‍රාම "ඉ" සඟරාව | 31 |
| 10) ජාතික විශ්‍රාම දින සැමරුම | 31 - 32 |
| 11) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හා නිලධාරීන් අතර සහ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම | 32 |

# පටුන


| | පිටු අංක |
|---|---|
| 12) විශ්‍රාමික ප්‍රජාව ශක්තිමත් කිරීම | 33 - 36 |
| 12.1 ණය පහසුකම් ලබා දීම | 33 - 34 |
| 12.2 දිවි අරුණ | 34 |
| 12.3 විශ්‍රාමික රක්ෂණ (බුහුමන්) | 34 |
| 12.4 විශේෂ අලෙවි ප්‍රවර්ධන පහසුකම් | 34 |
| 12.5 විශ්‍රාමික ප්‍රජාව කොළඹ සුරැකුම්පත් කොටස්කරුවන් බවට පත් කිරීම | 35 |
| 12.6 පුස්තකාල පහසුකම් සම්පාදනය | 35 |
| 12.7 සේවා ජාලයක් ස්ථාපිත කිරීම | 35 |
| 12.8 දැනුම්වත් කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය | 36 |
| 12.9 වෘත්තීය සමිති සන්ධානයන් අතර අවබෝධය පුළුල් කිරීම | 36 |
| 13) ආයතනික ඵලදායීතා ප්‍රවර්ධන කටයුතු | 36 - 37 |
| 13.1 ඵලදායිතා ජයග්‍රහණ | 37 - 38 |
| 14) නිලධාරී සුබ සාධනය සහ අභිවෘද්ධිය වෙනුවෙන් කැපවීම | 39 |
| 14.1 භෝජනාගාරය නවීකරණය කිරීම | 39 |
| 14.2 කාන්තා විවේකාගාරය | 39 |
| 14.3 බක්මහ උළෙල පැවැත්වීම | 39 - 40 |
| 15) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගිතාව | 40 |
| 16) පුද්ගලික අංශයේ දායකත්වය | 41 |
| 17) ගොඩනැගිලි භාවිතය හරහා ජාතික ආදායමට ලබා දුන් දායකත්වය | 41 - 42 |
| 18) තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම | 42 - 43 |

පිටු අංක

19) මානව සම්පත ප්‍රතිසංවිධානය කිරීම 43 - 48

19.1 පුහුණු ක්‍රියාවලිය ප්‍රතිසංවිධානය කිරීම 44 - 45

19.2 බාහිර පුහුණු 45

19.3 "සංකලන" බිත්ති පුවත්පත 46

19.4 ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව නිර්දේශිත ආයතනයක් බවට පත් වීම 46 - 47

19.5 බාහිර ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා 47

19.6 සිද්ධි අධ්‍යයන සඳහා දෙපාර්තමේන්තුව තෝරා ගැනීම 47

19.7 බාහිර ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා 47 - 48

19.8 සිද්ධි අධ්‍යයනය සඳහා දෙපාර්තමේන්තුව තෝරා ගැනීම 48

20) ප්‍රතිපත්ති හා සැලසුම් නවමු මාවතකට යොමු වීම 48 - 49

21) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 49 - 53

21.1 අභියෝග 52

22) අභ්‍යන්තර විගණනය 53

22.1 විගණන කළමනාකරණ කමිටු 53

22.2 දිස්ත්‍රික් මට්ටමේ විගණන ශක්තිමත් කිරීම 53

22.3 රාජ්‍ය විගණන කටයුතු 53

23) පරිපාලන වියදම් 54 - 59

24) දින 100 වැඩසටහන 60

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

## දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්

## මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයින් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL 3 | 01 | 01 | 00 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL 1 | 03 | 02 | 01 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS (Class I) | SL 1 | 01 | 01 | 00 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS (Class II or III) | SL 3 | 09 | 09 | 00 |
| | ගණකාධිකාරී | SLAcS (Class II or III) | SL 4 | 08 | 07 | 01 |
| | නි.අ/ස.අ. | SLICT Service II/ III | SL 5 | 01 | 00 | 01 |
| | නීති නිලධාරී | Dept | SL 6 | 01 | 00 | 01 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN 7 | 04 | 00 | 04 |
| | භාෂා පරිවර්තක | TS | MN 6 | 02 | 00 | 02 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICT Service | MN 6 | 05 | 00 | 05 |
| ද්විතීය මට්ටම | අයවැය සහකාර | Related Service | MN 4 | 01 | 01 | 00 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Related Service | MN 4 | 340 | 304 | 36 |
| | කාර්මික නිලධාරී | SLTS | MN 3 | 01 | 00 | 01 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | MN 2 | 190 | 108 | 82 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICT Service | MT 1 | 05 | 01 | 04 |
| | සංවර්ධන නිලධාරී | D/O | MN 4 | 398 | 348 | 50 |
| | ලේඛන සහකාර | Dept | MN 1 | 141 | 134 | 07 |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept | PL 1 | 02 | 02 | 00 |
| | අරක්කැමි/උද්‍යාන කම්කරු | Dept | PL 2 | 04 | 01 | 03 |
| | රියදුරු | D/S | PL 3 | 12 | 10 | 02 |
| | කාර්යාල කාර්ය සහයක | KKS | PL 1 | 56 | 48 | 08 |
| මුළු සංඛ්‍යාව | | | | **1185** | **978** | **207** |




වි.වැ.නි - විශ්‍රාම වැටුප් නිලධාරී
අ.ස - අයවැය සහකාර
ලේ.ස - ලේඛණ සහකාර
කා.සේ.සේ. - කාර්යාල සේවක සේවය

ස.නි - සංවර්ධන නිලධාරී
රා.ක.ස - රාජ්‍ය කළමනාකරණ සහකාර
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරී
බ.භා. - බංගලා භාරකරු

## විවරණය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරය නම් විශ්‍රාම වැටුප් හිමි රාජ්‍ය සේවකයන් වෙත අදාළ වන්නා වූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ නිරවද්‍යතාවය තහවුරු කර ගනිමින් ගෙවීම් ක්‍රියාවලිය නියාමනය කිරීමයි. ඒ අතර ප්‍රමුඛ කාර්යභාරය වන්නේ 565,000 ආසන්න වූ විශ්‍රාමික ප්‍රජාවක් වෙත මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සිදු කිරීමයි. තවද මෙකී විෂය ගත කාර්යභාරයෙන් ඔබ්බට යමින් මෙවන් සුවිශාල ප්‍රජාවක් හා ඔවුන්ගේ පවුල්වල අයවළුන් රැක බලා ගැනීම, ඔවුන් මෙරට ආර්ථික ප්‍රවාහයේ සජීවී කොටස්කරුවන් බවට පත් කර ගැනීමේ දැවැන්ත සමාජයීය කාර්යභාරයට උර දීම සහ ඔවුන් සතු පරිණත දැනුම හා කුසලතා සමාජයීය සංවර්ධනය උදෙසා නැවත භාවිත කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වීම ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතු කාර්යභාරය යැයි අපි විශ්වාස කරමු.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි වසර 2014 කාර්යසාධන වාර්තාවෙන් එකඟ වූ පරිදි එම වසර අග භාගයේ සිට සියලු විශ්‍රාමික ප්‍රජාව වෙත අදාළ ප්‍රතිලාභ ප්‍රමාදයකින් තොරව ගෙවීම් සිදු කිරීම සඳහා නවීන තොරතුරු තාක්ෂණය, ප්‍රතිපත්තිමය තීරණ හා නව කළමනාකරණ ප්‍රවණතා යොදා ගැනීම සිදු විය. විනිවිදභාවයෙන් යුතුව ගෙවීම් සිදු කිරීම මඟින් විශ්‍රාමික ප්‍රජාව වෙත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා සිය හිමිකම් පිළිබඳව විශ්වාසනීයත්වයක් ගොඩනගා ගැනීමටත් 2015 වසර තුළදී හැකියාව ලැබී ඇත. විශ්‍රාමික ප්‍රජාව වෙත ප්‍රථම මාසික විශ්‍රාම වැටුප් ගෙවීම විශ්‍රාම ලැබීමෙන් එළැඹෙන පළමු මාසය තුළ දී ගෙවීමටත් පාරිතෝෂික මුදල විශ්‍රාම ලැබීමෙන් දින හතක් ඇතුළත ගෙවීමටත් ඒ අනුව හැකි වී ඇත.

වසර 2015 දී දෙපාර්තමේන්තුව අත්පත් කරගත් සුවිසල් ප්‍රගතිය නම් විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධව පැවති දුර්මත ඉවත් කරමින්, මධ්‍යගත දත්ත පද්ධතිය ක් ඔස්සේ ගෙවීම් ආරම්භ කිරීමත්, 2014 වසරේ ඇරැඹි මාර්ගගත සංඛ්‍යාංක (online) ක්‍රියාවලිය තවදුරටත් ඉදිරියට ගෙන යමින් සිදුකළ දැවැන්ත තාක්ෂණික පරිවර්තනයකට දෙපාර්තමේන්තු කාර්යභාරයන් නතු කිරීමත් ය. මේ අනුව සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් සම්බන්ධීකරණය කරමින් එසැණින් ( real time ) සේවා සැපයීමට හැකි වීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ළඟා කරගත් සාධනීය වර්ධනයයි.

විශ්‍රාමික ප්‍රජාව තුළ පීඩනයක්ව පැවති 2006 රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීමේ ප්‍රතිලාභය නොලද විශ්‍රාමිකයන් වෙත වසර 10කට පසු නව රජය විසින් එම ප්‍රතිලාභ ලබාදීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සකස් කරන ලදී. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ලද ඉහත තාක්ෂණික පෙරළියේ ප්‍රතිඵලයක් ලෙස කඩිනමින් විශ්‍රාමික ප්‍රජාව වෙත එම ප්‍රතිලාභ හිමිකම තහවුරු කිරීමට ලැබීම අභිවර්ධනීය ගමන් මඟෙහි සන්ධිස්ථානයකි.

තව ද පෞද්ගලික අංශය තුළ පරමාදර්ශී රාජ්‍ය ආයතන ය බවට පත් වෙමින් ඔවුන්ගේ අධ්‍යයනයට නිරීක්ෂණයන්ට බඳුන් වූ අතර විදේශීය නිරීක්ෂකයන් වෙත හඳුන්වා දිය හැකි පූර්වාදර්ශී රාජ්‍ය ආයතනයක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තෝරා ගනු ලැබීය. ඒ අනුව ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් යොමු කළ විදේශීය විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව භාවිත කිරීම අප වඩාත් ඵලදායී ගමන් මඟකට යොමු කළ පන්නරය විය. ඒ අනුව ජාතික ඵලදායිතා සම්මාන 2014 සම්මානයෙන් පිදුම් ලැබීමට 2015 වසර අගභාගයේ දී අප දෙපාර්තමේන්තුවට හැකි විය.

අභියෝග රැසක් බිඳහෙළමින් පැමිණි මෙම වසර තුළ පුද්ගලික අංශයේ මඟපෙන්වීම හා සහයෝගය හේතුකොටගෙන නවීන සංකල්පයන් ක්‍රියාත්මක කිරීමට මෙන් ම නවතම සේවාවන් රැසක් විශ්‍රාමික ප්‍රජාව වෙත ලබාදීමට හැකිවීම දෙපාර්තමේන්තු කාර්යභාරයන්හි

ඉදිරි ගමනට මහත් පිටුබලයක් විය. මේ අනුව 2015 වසර තුළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමස්ත විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් සිදුකළ මහඟු මෙහෙවර හා දිනෙන් දින යාවත්කාලීන වන දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් කාර්යක්ෂමව හා වගවීමෙන් පවත්වාගෙන

යාම සඳහා නව රජයේ අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, සියලුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ජාලයන්, විශ්‍රාමික ප්‍රජාව මෙන් ම දෙපාර්තමේන්තුවේ සමස්ත සේවක මණ්ඩලයේත් කැපවීම සහ අගනා සේවය ස්තූති පෙරදැරිව සිහිපත් කළ යුතු ය.



## 1. විශ්‍රාම වැටුප් ලියාපදිංචිය හා ප්‍රතිලාභ ප්‍රදානය

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ වැදගත් ම පියවර වන්නේ රාජ්‍ය සේවාවේ තම සේවා කාලය අවසන් කිරීමෙන් පසුව සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීම් ක්‍රියාවලියේ ආරම්භය සඳහා ලියාපදිංචි වීමයි. අදාළ ආයතනය විසින් එම කාර්යය ඉටුකිරීම සඳහා වන අයදුම්පත දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් එම ප්‍රතිලාභිලයා වෙත විශ්‍රාම වැටුප් අංකයක් ලබාදීමෙන් පසුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් මාසික විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභියකු බවට පත්වේ.

ප්‍රස්තාර 01




වගුව 01

| මාසය | ලියාපදිංචි කළ ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 2496 |
| පෙබරවාරි | 1901 |
| මාර්තු | 1957 |
| අප්‍රේල් | 1708 |
| මැයි | 1975 |
| ජූනි | 1514 |
| ජූලි | 1569 |
| අගෝස්තු | 1517 |
| සැප්තැම්බර් | 1394 |
| ඔක්තෝම්බර් | 1325 |
| නොවැම්බර් | 964 |
| දෙසැම්බර් | 792 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

ප්‍රස්තාර 02




වගුව 02

| මාසය | ලියාපදිංචි කළ ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 1911 |
| පෙබරවාරි | 2228 |
| මාර්තු | 1963 |
| අප්‍රේල් | 1911 |
| මැයි | 2448 |
| ජූනි | 2396 |
| ජූලි | 1853 |
| අගෝස්තු | 2344 |
| සැප්තැම්බර් | 2783 |
| ඔක්තෝම්බර් | 2046 |
| නොවැම්බර් | 2110 |
| දෙසැම්බර් | 2767 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

මේ අනුව පසුගිය 2014 වසර තුළ රාජ්‍ය ආයතන හරහා ඉදිරිපත් කර තිබූ විශ්‍රාම වැටුප් පිළිගැන්වීම් 22,000ක් ලියාපදිංචි කර ඔවුන් විශ්‍රාම වැටුප් ගෙවීම් පද්ධතියට එක් කර ගැනීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිදු කර ඇත. එම ලියාපදිංචි කිරීම් අතර සිවිල් සේවාවේ නිලධාරීන් හා සන්නද්ධ හමුදා හා පොලීසියේ නිලධාරීන් ද ඇතුළත් වේ. රාජ්‍ය සේවයේ යෙදෙමින් සිටියදී මියගිය රාජ්‍ය

නිලධාරීන්ගේ මරණ පාරිතෝෂික ලියාපදිංචිය ද මෙයට ඇතුළත් විය.

ප්‍රස්තාර 03




වගුව 03

| මාසය | ලියාපදිංචි කළ ප්‍රමාණය 2014 | ලියාපදිංචි කළ ප්‍රමාණය 2015 |
|---|---|---|
| ජනවාරි | 2496 | 1911 |
| පෙබරවාරි | 1901 | 2228 |
| මාර්තු | 1957 | 1963 |
| අප්‍රේල් | 1708 | 1911 |
| මැයි | 1975 | 2448 |
| ජුනි | 1514 | 2396 |
| ජූලි | 1569 | 1853 |
| අගෝස්තු | 1517 | 2344 |
| සැප්තැම්බර් | 1394 | 2783 |
| ඔක්තෝම්බර් | 1325 | 2046 |
| නොවැම්බර් | 964 | 2110 |
| දෙසැම්බර් | 792 | 2767 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

මීට අමතරව, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබමින් සිටින අතරතුර, එම ප්‍රතිලාභීන් වෙත රාජ්‍ය සේවාවේ සිටියදී හිමිවිය යුතු වැටුප් වර්ධක, උසස්වීම් ආදිය නොලැබීම නිසා ඔහුට සිදු වූ අහිමිවීම් නැවත ලබාදීමට ඔහු සේවය කළ රාජ්‍ය ආයතනය විසින් තීරණය කළ පසු ඔහුට හිමි නව විශ්‍රාම වැටුප හා ඒ හා බැඳුනු අනිකුත් ප්‍රතිලාභ පිළිගැන්වීම ද මෙම දෙපාර්තමේන්තුව තුළ වාර්ෂිකව සිදුකරනු ලබයි.

වසර 2015 දී දක්නට ලැබුණු වැදගත් ම සිදුවීම වන්නේ මෙවැනි ප්‍රතිලාභ හිමිගැන්වීම් අතිවිශාල ලෙස ඉහළ ගිය බවයි. මෙයින් ගම්‍ය වන්නේ රාජ්‍ය සේවාවේ විශ්‍රාම ගැන්වීමේ ක්‍රියාවලිය සම්බන්ධව අනිකුත් රාජ්‍ය ආයතන හා විශ්‍රාමිකයාගේ උනන්දුව අවම වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් නැවත සකස් කිරීමට දෙපාර්තමේන්තුවට සිදු වී ඇති බවයි.

ප්‍රස්තාර 04




වගුව 04

| මාසය | සංශෝධිත සේවා විශ්‍රාම වැටුප් |
|---|---|
| ජනවාරි | 25 |
| පෙබරවාරි | 31 |
| මාර්තු | 83 |
| අප්‍රේල් | 38 |
| මැයි | 34 |
| ජුනි | 26 |
| ජූලි | 36 |
| අගෝස්තු | 48 |
| සැප්තැම්බර් | 75 |
| ඔක්තෝම්බර් | 102 |
| නොවැම්බර් | 78 |
| දෙසැම්බර් | 18 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

එමෙන් ම, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලියාපදිංචිය, වැන්දඹු පුරුෂ, අනත්දරු, ආබාධිත ප්‍රතිලාභීන් ලියාපදිංචිය ද දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන ඉතා වැදගත් කාර්යභාරයකි. ඒ අනුව මෙම වසර තුළ විශ්‍රාමිකයන් 22,000ක් පමණ ලියාපදිංචි කිරීමට සමර්ථ වී ඇත.

**ප්‍රස්තාර 05**




**වගුව 05**

| මාසය | සිවිල් | හමුදා |
|---|---|---|
| ජනවාරි | 1397 | 514 |
| පෙබරවාරි | 1551 | 677 |
| මාර්තු | 1393 | 570 |
| අප්‍රේල් | 1382 | 529 |
| මැයි | 1764 | 684 |
| ජූනි | 1599 | 797 |
| ජූලි | 1194 | 659 |
| අගෝස්තු | 1820 | 524 |
| සැප්තැම්බර් | 2155 | 628 |
| ඔක්තෝම්බර් | 1524 | 522 |
| නොවැම්බර් | 1516 | 594 |
| දෙසැම්බර් | 1847 | 920 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

2015 වසර තුළදී මෙම ක්‍රියාවලිය නවීකරණය කිරීමට ලැබීම විශ්‍රාම වැටුප් හිමිකම්ලාභීන් ලද ජයග්‍රහණයක් වන අතර, දෙපාර්තමේන්තුවෙහි කාර්යපටිපාටීන් සරලවීම කළමනාකරණයට පහසු වූ බව ද පෙන්වා දිය හැකි ය.

විශේෂයෙන් ම වසර 117ක් පැරණි වැන්දඹු අනත්දරු ප්‍රතිලාභ හිමිගැන්වීමේ ක්‍රියාවලිය සඳහා භාවිත වූ පනත ප්‍රතිසංශෝධනය කිරීමට ලැබීම 2015 වසරේ සිදු කරන ලද ඉතා වැදගත් කාර්යභාරයකි. ලියාපදිංචි අංශයේ කටයුතු විමර්ශනයේදී නිරීක්ෂණය කළ ප්‍රධාන කාර්යයක් වන්නේ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන අයදුම්පත්‍ර 20%කට ආසන්න ප්‍රමාණයක් නැවත එම ආයතනවලට ම යොමු කිරීමට සිදුවීමයි.

**ප්‍රස්තාර 06**




මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

මෙමගින් විශ්‍රාම වැටුප් ප්‍රදානය සඳහා වැඩි කාලයක් ගතවන හෙයින් විශ්‍රාමලාභියා අතෘප්තියට පත්වීම වන අයුරු නිරීක්ෂණය කළ හැකි විය. මෙමගින් ද ගම්‍යවන්නේ විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය පිළිබඳව ආයතනය හා සම්බන්ධ රාජ්‍ය සේවකයා තුළ නිවැරදි අවබෝධයක් නොමැති වූ බවයි.

වගුව 06

| මාසය | සිවිල් | හමුදා | මරණ පාරිතෝෂික/ සංශෝධන සහ වෙනත් |
|---|---|---|---|
| ජනවාරි | 783 | 262 | 578 |
| පෙබරවාරි | 1169 | 558 | 383 |
| මාර්තු | 883 | 338 | 409 |
| අප්‍රේල් | 1015 | 318 | 395 |
| මැයි | 630 | 383 | 479 |
| ජුනි | 1340 | 618 | 752 |
| ජූලි | 1073 | 594 | 544 |
| අගෝස්තු | 881 | 470 | 516 |
| සැප්තැම්බර් | 1064 | 424 | 916 |
| ඔක්තෝම්බර් | 957 | 500 | 657 |
| නොවැම්බර් | 1010 | 518 | 757 |
| දෙසැම්බර් | 777 | 506 | 713 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

මෙවැනි අඩුපාඩුකම් මගහරවාගැනීමට හැකිවන අයුරින් විශ්‍රාම වැටුප් පිළිගැන්වීමේ කාර්යපටිපාටිය ඒකාබද්ධ කර ඇති අතර, ඒ පිළිබඳව දැනුම්වත් කිරීමට දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙකී ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් කාර්යක්ෂම මෙන් ම සරල කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණික විසඳුම් කෙරෙහි අවධානය යොමු වූ අතර ලියාපදිංචි අංක ලබා දීම මාර්ගගත(**online**) ක්‍රමය මඟින් නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කිරීම මෙම වසරේ දී ආරම්භ විය.

ඒ අනුව මාර්ගගත අයදුම්පත්‍ර (**online applications**) වෙබ් අඩවිය ඔස්සේ සම්පූර්ණ කර අනෙකුත් ලියවිලි පරිලෝකනය කර ඊට ම ඇමුණුම් වශයෙන් එක් කිරීමත් වෙනත් ලියකියවිලි ගණුදෙනු විද්‍යුත් තැපෑල මඟින් සිදු කිරීමත් සිදුවේ.ඒ අනුව ලිපි ගණුදෙනු සඳහා වැයවන පිරිවැය මෙන් ම කාලය ද අවම කර ගැනීමට හැකි වී ඇත.

ඒ අනුව වසරකට රුපියල් මිලියන එකසිය පනහක පමණ මුදලක් ඉතිරි කර ගත හැකි විය. එහි ප්‍රතිලාභය පෙරලා සමස්ත රටවැසියනට ම ලබා දිය හැකි වූ අතර මේ නව ක්‍රියාවලිය මඟින් විශ්‍රාමික ප්‍රජාවගේ විශ්‍රාම වැටුප් ගෙවීම් කඩිනමින් නියමිත දිනට සිදු කළ හැකි වීම මෙහි අග්‍ර ප්‍රතිලාභය ලෙස හැඳින්විය හැකි ය.

ප්‍රස්තාර 07




වගුව 07

| මාසය | 2014 වර්ෂය | 2015 වර්ෂය |
|---|---|---|
| ජනවාරි | 70 | 62 |
| පෙබරවාරි | 93 | 53 |
| මාර්තු | 78 | 86 |
| අප්‍රේල් | 85 | 95 |
| මැයි | 50 | 81 |
| ජුනි | 119 | 62 |
| ජූලි | 119 | 119 |
| අගෝස්තු | 88 | 64 |
| සැප්තැම්බර් | 124 | 94 |
| ඔක්තෝම්බර් | 90 | 66 |
| නොවැම්බර් | 68 | 73 |
| දෙසැම්බර් | 59 | 83 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

තව ද මේ නවීන තොරතුරු තාක්ෂණික ක්‍රියාකාරකම් සමඟ රාජ්‍ය සේවයේ නිලධාරීන් මෙන් ම විශ්‍රාමික ප්‍රජාව ද එකසේ සම්බන්ධ කර ගැනීමට හැකි වීම

තොරතුරු තාක්ෂණය සමඟ බද්ධ වෙමින් රටක් වශයෙන් ගෝලීය සමාජයේ අනන්‍යතාවය ගොඩනගා ගැනීමට ප්‍රයත්න දරණ මොහොතක අප ලද විශිෂ්ඨ ජයග්‍රහණයක් සේ සැලකිය හැකි ය.

එකී අප ලද සුවිශාල අත්දැකීම් හා ජයගත් අභියෝග පන්නරයක් කර ගනිමින් ඉදිරියේ දී සියලු කටයුතු සඳහා මාර්ගගත විසඳුම් (**online solution**) සෙවීමට අපි කටයුතු කරමින් සිටිමු.

## 2. විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වන්නේ දැනටමත් විශ්‍රාම ලබා ඇති හා ඉදිරියේ දී විශ්‍රාම ලැබීමට අපේක්ෂිත රාජ්‍ය සේවකයන් ඇතුළු විශ්‍රාමික ප්‍රතිලාභීන්ට හිමි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාවලිය සිදු කිරීමයි. මේ අනුව මෙම වසර තුළ විශ්‍රාම වැටුප් ගෙවීම් පාරිතෝෂික ගෙවීම්, 2015 නව විශ්‍රාම වැටුප් ගෙවීම්, වැන්දඹු අනත්දරු ගෙවීම්, හමුදා විශ්‍රාම වැටුප් ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම්, වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම් යන කාණ්ඩ යටතේ සිදු විය.

**ප්‍රස්තාර 08**




**වගුව 08**

| මාසය | විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍ර ලබා දීම් |
|---|---|
| ජනවාරි | 1045 |
| පෙබරවාරි | 1727 |
| මාර්තු | 1221 |
| අප්‍රේල් | 1333 |
| මැයි | 1960 |
| ජූනි | 1667 |
| ජූලි | 1667 |
| අගෝස්තු | 1351 |
| සැප්තැම්බර් | 1488 |
| ඔක්තෝම්බර් | 1457 |
| නොවැම්බර් | 1528 |
| දෙසැම්බර් | 1283 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

මේ අනුව විශ්‍රාමිකයින් 565,000 වෙත පසුගිය වසර තුළ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් සිදුකළ අතර, එම ප්‍රමාණය රු. බිලියන 142 කි. මෙම මුදල රටේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 1.7% ක් වන අතර, රජයේ වාර්ෂික ආදායමෙන් 12.5%කි. මෙවැනි විශාල මුදලක් ගෙවීම තුළින් රජය අපේක්ෂා කරනු ලබන්නේ මාතෘභූමිය ගොඩ නැගීමට දායක වූ රාජ්‍ය සේවකයන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීමයි.

මෙම ක්‍රියාවලිය විශ්‍රාමිකයාට පමණක් සීමා නොවන අතර, විශ්‍රාමිකයා, වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයා, අනත්දරුවන් සහ විශේෂයෙන් ම ආබාධිත දරුවන්ගේ සමාජ ආරක්ෂාව ද තහවුරු කරමින්, අන්තර් පරම්පරා කිහිපයක සමාජ ආරක්ෂණ ක්‍රමයක් බවට තහවුරු වී ඇත.

මෙය රට තුළ සිදු කරන අනිකුත් සමාජ ආරක්ෂණ පද්ධති හා සංසන්දනය කිරීමේ දී ඉතා දැවැන්ත වැඩපිළිවෙලක් බව පෙනී යයි. විශේෂයෙන් ම දෙපාර්තමේන්තුවෙහි කටයුතු පිළිබඳ පසුගිය වසර කිහිපයකට අදාළව කළ අධ්‍යයනයෙන් පෙනී ගිය වැදගත් කරුණක් වන්නේ නිරන්තර හිඟ වැටුප් ගෙවීම් ක්‍රියාවලිය හේතුවෙන් බොහෝදුරට

දෙපාර්තමේන්තුව තුළ වංචා හා මූල්‍ය අවභාවිතයන් සිදු වූ බවයි.

**ප්‍රස්තාර 09**




**වගුව 09**

| මාසය | සිවිල් | වැන්දඹු අනත්දරු |
|---|---|---|
| ජනවාරි | 386068 | 136612 |
| පෙබරවාරි | 377073 | 171960 |
| මාර්තු | 375305 | 174804 |
| අප්‍රේල් | 369947 | 180829 |
| මැයි | 370656 | 181056 |
| ජුනි | 372429 | 181704 |
| ජුලි | 373655 | 182053 |
| අගෝස්තු | 374758 | 182127 |
| සැප්තැම්බර් | 375807 | 182026 |
| ඔක්තෝම්බර් | 377085 | 181923 |
| නොවැම්බර් | 378247 | 182054 |
| දෙසැම්බර් | 378520 | 181942 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

මෙම හිඟ වැටුප් ගෙවීම විධිමත් කිරීම සඳහා විශේෂ ඒකකයක් පිහිටුවීමෙන් සිදු කරන ලද ක්‍රියාවලියේ දී හිඟ වැටුප් ගෙවීම අඩුකර ගැනීමට පසුගිය වසරේ දෙපාර්තමේන්තුවට හැකි වූ බව පෙන්වා දිය හැකි ය. මූල්‍ය අවභාවිතයන් ඒ අයුරින් පාලනය කිරීමට හැකි වීම 2015 වසර තුළ දෙපාර්තමේන්තුව ලද සුවිශේෂී ප්‍රගතියට සාදක විය.

## 2.1 ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය

වසර 2014 අවසාන භාගයේ ආරම්භ කරනලද ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කිරීමට ලැබීම විශ්‍රාමික ප්‍රජාව ලද ජයග්‍රහණයකි. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබන විශ්‍රාමිකයාට හිමි විශ්‍රාම පාරිතෝෂික මුදල හිමිකම් ප්‍රදානයේ සිට දින 7 ක් ඇතුළත ගෙවීමට කටයුතු කිරීමත්, විශ්‍රාම වැටුප පිළිගැන්වීමෙන් අනතුරුව එළඹෙන පළමු මාසය තුළ දී මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමත් ප්‍රථම ගෙවීම් අංශයේ කාර්යභාරය වේ.

**ප්‍රස්තාර 10**




**වගුව 10**

| මාසය | සිවිල් | හමුදා |
|---|---|---|
| ජනවාරි | 92,466,459.65 | 41,125,283.75 |
| පෙබරවාරි | 178,751,884.18 | 51,458,738.66 |
| මාර්තු | 95,552,308.79 | 59,327,214.79 |
| අප්‍රේල් | 111,570,120.02 | 77,897,837.09 |
| මැයි | 88,687,519.96 | 31,795,204.14 |
| ජුනි | 192,106,741.65 | 58,290,555.15 |
| ජුලි | 171,953,329.82 | 61,365,290.95 |
| අගෝස්තු | 136,864,181.86 | 49,028,759.01 |
| සැප්තැම්බර් | 150,268,993.20 | 45,851,939.33 |
| ඔක්තෝම්බර් | 151,617,816.11 | 49,479,083.14 |
| නොවැම්බර් | 186,700,524.13 | 52,103,970.55 |
| දෙසැම්බර් | 155,444,511.26 | 38,744,467.39 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

මෙමඟින් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිගැන්වීම පිළිබඳව විශ්‍රාමිකයා තුළ පැවති අවිනිශ්චිතභාවය නැති කර නිශ්චිත දිනට විශ්‍රාම වැටුප් ලබා දෙන බවට සහතික කිරීමට ලැබීම රාජ්‍ය සේවයේ යෙදුණු ජ්‍යෙෂ්ඨ පුරවැසියා කෙරෙහි දක්වන ලද ගෞරවය තවත් ප්‍රතිඵලයකි.

විශේෂයෙන් ම මීට පෙර විශ්‍රාම වැටුප් අංකයක් ලබාදී මාස 12කට වැඩි කාලයක් ප්‍රථම වැටුප් ලබාගැනීමට ගතවූ බව අපගේ නිරීක්ෂණ වලදී තහවුරු විය.

ප්‍රස්තාර 11




වගුව 11

| මාසය | ප්‍රථම ගෙවීම් නව ලියාපදිංචිය |
|---|---|
| ජනවාරි | 1923 |
| පෙබරවාරි | 1923 |
| මාර්තු | 2815 |
| අප්‍රේල් | 2637 |
| මැයි | 1282 |
| ජූනි | 845 |
| ජූලි | 649 |
| අගෝස්තු | 1296 |
| සැප්තැම්බර් | 1238 |
| ඔක්තෝම්බර් | 857 |
| නොවැම්බර් | 756 |
| දෙසැම්බර් | 1827 |

මූලාශ්‍රය - ලියාපදිංචි අංශය

මේ අනුව විශ්‍රාම වැටුප් ලියාපදිංචි ක්‍රියාවලිය ලියාපදිංචියකට පමණක් සීමා නොවී ඔහුගේ ප්‍රතිලාභ ක්ෂණිකව ලබාදීමට ක්‍රියා කිරීම මෙම වසර තුළ ලද සුවිශේෂී ජයග්‍රහණයන් අතර ප්‍රමුඛතාවය ගනී. කෙසේ වුවත් මෙම ක්‍රියාවලිය මඟින් විශ්‍රාම වැටුප් අනුමත කරන ආයතනවල කාර්යභාරය අවසන් නොවන අතර විශ්‍රාමිකයාට ප්‍රදාන පත්‍රය නිකුත් කිරීමේ වගකීම ඔවුන් වෙත පවරා ඇත. පසුගිය වසර වල දෙපාර්තමේන්තුව ලද නිරීක්ෂණවලින් පෙනී යන්නේ එම ප්‍රදාන පත්‍ර පිළිගැන්වීමේ ක්‍රියාවලිය තවදුරටත් ප්‍රමාද වන බවයි.

එම ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා විශේෂ ඒකකයක් දෙපාර්තමේන්තුවෙහි පිහිටුවීමෙන් මෙම සම්බන්ධීකරණය කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුව මඟින් සිදු කිරීම ආරම්භ කරනු ලැබීය.

## 2.2 විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය

රාජ්‍ය සේවකයකු විශ්‍රාම යාමේදී ක්ෂණිකව ගෙවීමට නියමිත විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය රාජ්‍ය සේවකයෙකුගේ සැඳෑ සමයේ දී ලැබෙන මහඟු ප්‍රතිලාභයකි. පසුගිය වසර තුළ එය දින 7ක් ඇතුළත ලබා දීමට හැකි වීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ලැබූ තවත් ජයග්‍රහණයකි. 2015 වසර තුළ දී එම වැඩසටහන ක්‍රියාකාරීව පවත්වා ගැනීමට නව රජය විසින් තීරණය කළ හෙයින් එය ශක්තිමත් කිරීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ගයන් මහා භාණ්ඩාගාරය විසින් සහතික කර දී ඇත. ඒ අනුව විශ්‍රාම වැටුප් පිළිගැන්වූ වහාම රාජ්‍ය බැංකුවක් තුළින් විශ්‍රාමිකයන්ගේ පාරිතෝෂික ප්‍රදානය කිරීමට හැකියාව විශ්‍රාමිකයා ලද මහත් අස්වැසිල්ලකි. මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීමෙන් මේ සඳහා ගෙවන පොළී ප්‍රතිශතය ද තවදුරටත් අඩු කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

ඒ අනුව එකවර ඔවුන් සතු මෙකී මුදල් ආර්ථික ප්‍රවාහයේ ඇතිවන කඩා වැටීමක දී හෝ උද්ධමනයන්ට වුව ගැළපෙන පරිදි ආයෝජන කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය විශේෂඥ උපදෙස් පෞද්ගලික අංශයේ හා

රාජ්‍ය අංශයේ ව්‍යවසායකයන් මඟින් ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව මේ පාරිතෝෂික ලබන විශ්‍රාමික ප්‍රජාව සාම්ප්‍රදායික විශ්‍රාමික භූමිකාවෙන් මුදවා නව ආර්ථික ප්‍රවණතා අනුව යන ආයෝජක ප්‍රජාවක් බවට ප ත් කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. 2015 වසර තුළදී ද එම වැඩසටහන ක්‍රියාකාරීව පවත්වාගැනීමට නව රජය විසින් තීරණය කරමින් එය ශක්තිමත් කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ගයන් මහාභාණ්ඩාගාරය විසින් සහතික කර දී ඇත.

**ප්‍රස්තාර 12**

**පාරිතෝෂික ගෙවීම් සඳහා බැංකු අනුව විශ්‍රාමිකයින් ප්‍රමාණය**




**වගුව 12**

| බැංකුව | විශ්‍රාමිකයන් ප්‍රමාණය |
|---|---|
| මහජන බැංකුව | 8530 |
| ලංකා බැංකුව | 7380 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 3885 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

ඒ අනුව, විශ්‍රාම වැටුප් පිළිගැන්වීම සිදු වූ වහාම රාජ්‍ය බැංකුවක් මඟින් විශ්‍රාමිකයන්ගේ පාරිතෝෂික ප්‍රදානය කිරීමට හැකිවීම විශ්‍රාමිකයා ලද මහත් අස්වැසිල්ලකි. මහා භාණ්ඩාගාරයේ මැදිහත්වීමෙන් මේ සඳහා ගෙවන පොළී ප්‍රතිශතය ද තවදුරටත් අඩු කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

මෙසේ විශ්‍රාමිකයාට හිමි පාරිතෝෂික මුදල නියමිත කාලයට නිවැරදිව ගෙවීමෙන් නොනැවතී ඔවුන් ලද එකී මුදලට ආර්ථික වශයෙන් වැඩි අගයක් එක් කිරීම සඳහාද වසර 2015 දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු ආරම්භ කරන ලදී.

**ප්‍රස්තාර 13**

**පාරිතෝෂික ගෙවීම මුදල්**




**වගුව 13**

| බැංකුව | මුදල් ප්‍රමාණය (රු.) |
|---|---|
| මහජන බැංකුව | 4163 |
| ලංකා බැංකුව | 3700.7 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 1878.9 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

ඒ අනුව මේ පාරිතෝෂික ලබන විශ්‍රාමික ප්‍රජාව සාම්ප්‍රදායික විශ්‍රාමික භූමිකාවෙන් මුදවා නව ආර්ථික ප්‍රවණතා අනුව යන ආයෝජක ප්‍රජාවක් බවට පත් කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

ඒ අනුව මේ පාරිතෝෂික ලබන විශ්‍රාමික ප්‍රජාව සාම්ප්‍රදායික විශ්‍රාමික භූමිකාවෙන් මුදවා නව ආර්ථික ප්‍රවණතා අනුව යන ආයෝජක ප්‍රජාවක් බවට පත් කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. එමෙන්ම මෙසේ ගෙවන පාරිතෝෂික මුදල දෙස ආර්ථික විද්‍යාත්මක මුහුණුවරින් බලන කල අපට නිරීක්ෂණය වූයේ එය මෙරට ආර්ථික ප්‍රවාහයේ දැවැන්ත වපසරියක් ආවරණය කරන බවයි.

ප්‍රස්තාර 14




වගුව 14

| මාසය | විශ්‍රාමිකයින් ප්‍රමාණය | මුදල රු.බිලියන |
|---|---|---|
| ජනවාරි | 2126 | 1010 |
| පෙබරවාරි | 1756 | 853 |
| මාර්තු | 2567 | 1262 |
| අප්‍රේල් | 1263 | 593 |
| මැයි | 1183 | 573 |
| ජූනි | 2133 | 1051 |
| ජූලි | 1007 | 522 |
| අගෝස්තු | 1141 | 592 |
| සැප්තැම්බර් | 1425 | 700 |
| ඔක්තෝම්බර් | 2010 | 990 |
| නොවැම්බර් | 675 | 325 |
| දෙසැම්බර් | 2510 | 1272 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

ප්‍රස්තාර 15




වගුව 15

| අංශය | මුදල රු |
|---|---|
| සිවිල් | 5747 |
| හමුදා | 3996 |
| මරණ | 323 |
| පාරිතෝෂික | 76 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

එනම් වසරකට විශ්‍රාම ලබන 22000 ක පමණ විශ්‍රාමික ප්‍රජාවක් අතට පත්වන මේ මුදල දළ වශයෙන් රුපියල් බිලියන 18ක් පමණ වේ.මෙකී සුවිශාල මුදල් සම්භාරය මෙරට ආර්ථිකයේ නැවත වරක් ආයෝජනය වීම යනු එකී ආයෝජකයින් ආර්ථික වශයෙන් සංවර්ධනය වීම පමණක් නොව එකී මුදල් සම්භාරය නැවත මෙරට ආර්ථික ප්‍රවාහයට එන්නත් වීමක් ලෙස ද අපි සලකමු.

මෙසේ අපගේ දීර්ඝකාලීන අරමුණු වන්නේ සියලු රාජ්‍ය සේවක ප්‍රජාව විශ්‍රාම දිවියට එළඹීමත් සමඟම ඔවුන් මේ රටේ ප්‍රමුඛ පෙළේ ආයෝජකයන් බවට පත් කිරීම ය.

ප්‍රස්තාර 16




වගුව 16

| අංශය | මුදල රු |
|---|---|
| සිවිල් | 12883 |
| හමුදා | 6912 |
| මරණ | 895 |
| පාරිතෝෂික | 3233 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

## 3. විශ්‍රාම වැටුප් ප්‍රදාන ක්‍රියාවලිය පහසු කිරිම.

විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම සඳහා හඳුන්වා දී තිබූ ‘අ’ ආකෘතිය වෙනුවට 3/2015 චක්‍රලේඛය මගින් ‘PD3’ නව විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රය හඳුන්වා දෙන ලදී. ඒ මගින් විශේෂයෙන් පහත සඳහන් ප්‍රතිලාභ අත් කරගන්නා ලදී.

1. විශ්‍රාම වැටුප් ප්‍රදානයට අදාළ වන සියලු දත්ත ඇතුළත්ව ඇති බැවින් දෙපාර්තමේන්තුවට වඩාත් පහසුවෙන් එය පරීක්ෂා කර තීරණ ගැනීමට හැකි වීම.

2. පිටපත් 05කින් අයදුම්පත් පිරවීම සහ විශ්‍රාමිකයා විසින් සෘජුව ම එවන ලද පිටපත් සියල්ල ලබාගැනීම තුළ ඇති වූ සංකීර්ණ තත්ත්වයන් නිම කරමින් ‘PD3’ අයදුම්පත් එක් පිටපතක් පමණක් ලබාගැනීම මගින් අනවශ්‍ය ලිපිලේඛන හුවමාරුව අවම කිරීම.

3. සියලු කාර්යයන් පහසුවෙන් ඉටු කරගැනීමට අවශ්‍ය තොරතුරු සියල්ල එකවර ලබාගැනීම.

4. පාරිතෝෂිකය ගෙවීම, මාසික විශ්‍රාම වැටුප් ගෙවීම , අනත්දරු, ආබාධිත ප්‍රතිලාභ ලබා දීම, දායක මුදල් ආපසු ලබාදීම, විශ්‍රාමික හැඳුනුම්පත ලබාදීම මෙන් ම දත්ත පද්ධතිය යාවත්කාලීන වීම ද එක ම අයදුම්පතක් මගින් සිදු කිරීමට හැකි වීම.

5. විශ්‍රාම වැටුප් ලිපිගොනුව සකස් කර ප්‍රදාන පත්‍රය නිකුත් කර, විශ්‍රාම යන අවස්ථාවේදී ඔහුගේ වැන්දඹු අනත්දරු ලිපිගොනුව යාවත්කාලීන වී තිබීම මගින් අනාගතයේදී එම පසුකාලීන ප්‍රතිලාභ හිමිකරදීමට පහසුවීම.

6. විශ්‍රාම වැටුප්, වැන්දඹු වැටුප්, අනත්දරු වැටුප්, ආබාධිත වැටුප් යන සිව් වැදෑරුම් හිමිකම් ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු එකවර ලබා ගැනීම ( 4 in I) හා එකී දත්ත ගබඩා කර තබා ගැනීම මගින් ඉදිරියේ දී ප්‍රතිලාභීන්ට කඩිනමින් නිරවුල්ව හා විනිවිදභාවයෙන් යුතුව අදාල ප්‍රතිලාභ ලබා දීමට පහසු වීම.

ප්‍රස්තාර 17




මෙමගින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කටයුතු සාර්ථක කරගැනීමට හා විශේෂයෙන් ම මෙම ක්‍රියාවලියට යන ලිපිද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අඩු කර ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීමට හැකිවීම සමස්ත රාජ්‍ය සේවය ම ලැබූ ජයග්‍රහණයකි.

වගුව 17

| මාසය | විශ්‍රාමිකයින් ප්‍රමාණය |
| --- | --- |
| ජනවාරි | 547844 |
| පෙබරවාරි | 549033 |
| මාර්තු | 550109 |
| අප්‍රේල් | 550776 |
| මැයි | 551712 |
| ජූනි | 554133 |
| ජූලි | 555708 |
| අගෝස්තු | 556885 |
| සැප්තැම්බර් | 557833 |
| ඔක්තෝම්බර් | 559008 |
| නොවැම්බර් | 560301 |
| දෙසැම්බර් | 560462 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

### 3.1 විශ්‍රාම වැටුප් ප්‍රදානය

මේ මගින් විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය වඩාත් සරල ක්‍රියාදාමයක් බවට පත්කෙරිණි. විශ්‍රාම වැටුප් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ සංකීර්ණ බව අඩු කර විශ්‍රාමිකයන්ගේ තොරතුරු එකවර ලබාගෙන දත්ත පද්ධතිය පිළියෙල කිරීම සහ කඩිනම් කිරීම සිදුකරනු ලැබී ය. එමෙන් ම නව

උපදේශන රාශියක් මෙම වසර තුළ නිකුත් කරනු ලැබූ අතර, එමගින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය ඉතා පැහැදිලි විනිවිදභාවයෙන් යුක්ත සරල වැඩපිළිවෙලක් බවට පත් කරගැනීමටත් හැකියාව ලැබුණි.

## 4. ක්‍රියාපටිපාටි සංවර්ධනය

### 4.1 ගෙවීම් කටයුතු ප්‍රවර්ධනය

මාසික විශ්‍රාම වැටුප ගෙවීමේදී එම ගෙවීම් ක්‍රියාවලිය මෙතෙක් පැවතුණේ ඉතා සංකීර්ණ තත්ත්වයක යි . එහිදී සෘජුවම බැංකු ගිණුම්වලට මුදල් යැවීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හරහා බැංකු පද්ධති වෙත මුදල් ප්‍රේෂණය කිරීම, බැංකු ප්‍රධාන කාර්යාලයන් හරහා බැංකු උප ශාඛා වෙත මුදල් නිදහස් කිරීම වැනි විවිධ ක්‍රම මගින් ගෙවීම් ක්‍රියාවලිය සිදුකරන ලදී.

ප්‍රස්තාර 18




වගුව 18

| වර්ෂය | මුදල රු |
| --- | --- |
| 2012 | 65 |
| 2013 | 47 |
| 2014 | 32 |
| 2015 | 28 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

එම ක්‍රියාවලිය වඩාත් සරල කිරීමේ අරමුණින් මාසික විශ්‍රාම වැටුප සෘජුව ම විශ්‍රාමිකයාගේ ගිණුමට ප්‍රේෂණය කිරීමේ හැකියාව පිළිබඳ සියලු ම බැංකු සමඟ සාකච්ඡා පවත්වනු ලැබිය. ඒ අනුව පැමිණි එකඟතාවය මත මාසික විශ්‍රාම වැටුප් දත්ත දෙපාර්තමේන්තුව විසින් සෘජුවම බැංකු ප්‍රධාන කාර්යාලයන් වෙත ලබාදී විශ්‍රාමිකයන්ගේ ගිණුම් වෙත සෘජුවම ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

මෙම ක්‍රියාවලිය මඟින් දෙපාර්තමේන්තුවට මෙන් ම, ඒ හා සක්‍රියව සම්බන්ධ වන බැංකු පද්ධතිය වෙත ද විශාල පහසුවක් ඇතිවූවා පමණක් නොව, කාලය,

ශ්‍රමය සහ අනෙකුත් පොදු කාර්යය පිරිවැය විශාල ලෙස ඉතිරි කරගැනීමට හැකියාව උදා විය.

තවද, එම ක්‍රියාවලිය සරල කිරීම මඟින් මාසික විශ්‍රාම වැටුප ගෙවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් මඟින් මුද්‍රණය කර බෙදා හරිනු ලබන මාසික ගෙවීම් ලේඛනය නිකුත් කිරීමේ ක්‍රියාවලිය නතර කිරීමට හැකි විය. එමගින් මුද්‍රණ සහ තැපැල් වියදම් සඳහා දරන ලද වියදම විශාල ලෙස අවම කරගැනීමට ද හැකියාව ලැබිණි.

## 4.2 හිඟ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය ප්‍රතිසංවිධානය

විවිධාකාර හේතූන් මත විශ්‍රාම ගැන්වීමේදී විශාල වශයෙන් හිඟ වැටුප් ගෙවීමට සිදු වූ අතර එම හිඟ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය පැවතුණේ ඉතාම සංකීර්ණ තත්ත්වයක යි. අදාළ හිඟ වැටුප් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් මගින් සකස් කර දෙපාර්තමේන්තුව වෙත එවීම හේතුවෙන් එම හිඟ වැටුප් සහ මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය නිසි අභ්‍යන්තර පාලනයකට ලක් කිරීම අපහසු විය. හිඟ වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය තුළ නොයෙකුත් අක්‍රමිකතාවන් සිදු වීමට ඇති අවස්ථාවන් සුලබ බව ද නිරීක්ෂණය කළ හැකි විය.

එබැවින්, හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් නිසි අභ්‍යන්තර පාලනයකින් සහ පරීක්ෂාවකින් යුක්තව සිදු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මතු විය. සිවිල් විශ්‍රාම වැටුප ගෙවීමේ ප්‍රමාදය, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමේ ප්‍රමාදය සහ දෙපාර්තමේන්තුව විසින් අනුමත කිරීමෙන් අනතුරුව කරනු ලබන නොයෙකුත් ගෙවීම් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට යොමු කර තොරතුරු නැවත ගෙන්වා ගැනීමට සිදු වන බවත් එහි දී නිරීක්ෂණය විය. ඒ අනුව හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් නව ක්‍රමවේදයක් හඳුන්වාදෙන ලදී.

1. ප්‍රථම ගෙවීම් ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කිරීම
2. යැපෙන්නන්ට යැපීම් දීමනා ගෙවීම සෘජුවම දෙපාර්තමේන්තුව මඟින් ආරම්භ කිරීම
3. වැන්දඹු අනත්දරු ගෙවීම් කටයුතු ප්‍රදානය සෘජුවම දෙපාර්තමේන්තුව මඟින් සිදුකිරීම
4. හිඟ වැටුප් ගෙවීමේ කටයුතු පරීක්ෂා කිරීම සඳහා වෙනම අංශයක් පිහිටුවනු ලැබීම

එමෙන්ම ගෙවීම් ක්‍රියාපටිපාටිය අවස්ථා කිහිපයකදී ම සංශෝධනය කරන ලද අතර, ප්‍රථමයෙන් ඒ සඳහා හිඟ ගෙවීම් විස්තර දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීමට විශේෂිත වූ ආකෘතියක් හඳුන්වාදෙන ලදී. ඉන් අනතුරුව මෙම ආකෘතිය තවදුරටත් සරල කරමින් හිඟ වැටුප් විස්තර දෙපාර්තමේන්තුවට ගෙන්වාගෙන පරීක්ෂා කිරීමෙන් අනතුරුව, මාසික ගෙවීම් ක්‍රියාවලියට පරිබාහිරව වෙනත් පද්ධතියක් මඟින් හිඟ වැටුප් ගෙවීමේ කටයුතු සිදුකරන ලදී. හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු වඩාත් නිවැරදි ලෙසත්, මනා අභ්‍යන්තර පාලනයකින් හා පරීක්ෂාවකින් කිරීමට එමගින් අවස්ථාව ලැබී තිබේ.

## 4.3 මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය මධ්‍යගත කිරීම

මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් 332ක් මඟින් විමධ්‍යගතව සිදුකරනු ලැබී ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් 332හිදී ම ගෙවීම් දත්ත පද්ධති වෙන් වෙන්ව පවත්වාගෙන යන ලදී. මෙහිදී මාසිකව අවශ්‍ය දත්ත දෙපාර්තමේන්තුව වෙත ගෙන්වාගෙන ඒකාබද්ධ කරමින් බැංකු පද්ධති සහ තැපැල් කාර්යාලයන් වෙත ප්‍රේෂණය කිරීම සිදු විය. මේ ක්‍රමවේදය නිසි අභ්‍යන්තර පරීක්ෂාවකට සහ පාලනයකට ලක් කිරීම අපහසු වූ බැවින් ගෙවීම් ක්‍රියාවලියේ නිරවද්‍යතාවය පිළිබඳ විශ්වසනීයභාවය අවම මට්ටමක පැවතුණි. එමෙන් ම, නව විශ්‍රාමිකයන් පද්ධතියට එකතුවීමේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවී ය.

ප්‍රස්තාර 19




වගුව 19

| මාසය | විශ්‍රාමිකයින් ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 547844 |
| පෙබරවාරි | 549033 |
| මාර්තු | 550109 |
| අප්‍රේල් | 550776 |
| මැයි | 551712 |
| ජූනි | 554133 |
| ජූලි | 555708 |
| අගෝස්තු | 556885 |
| සැප්තැම්බර් | 557833 |
| ඔක්තෝම්බර් | 559008 |
| නොවැම්බර් | 560301 |
| දෙසැම්බර් | 560462 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

මාසික ගෙවීමේ කටයුතු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත නිදහස් කරන මුදල් ප්‍රමාණයේ නිරවද්‍යතාවයන් නිශ්චය කරගැනීමට දෙපාර්තමේන්තුව සතුව හැකියාවක් නොතිබීම මත බරපතල ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය විය. වියදම් ගිණුම්ගත කිරීම සහ වාර්තා කිරීම නිරවද්‍යතාවයකින් යුතුව සිදු කළ යුතු වූ හෙයින් උක්ත ගැටලු වලට කඩිනම් විසඳුම් සෙවීම දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානත ම කාර්යයන් අතර විය.

මෙම අර්බුදකාරී තත්ත්වය මඟහරවා ගනිමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් මට්ටමින් පවත්වාගෙන ගිය සියලු දත්ත පද්ධතීන් ඒකාබද්ධ කරමින් මධ්‍යගත දත්ත පද්ධතියක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය. ඒ අනුව, සියලුම දත්ත පද්ධතීන් ඒකාබද්ධ කරමින් මධ්‍යගත දත්ත පද්ධතියක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කරන ලදී.

දෙපාර්තමේන්තුවේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු මධ්‍යගත දත්ත පද්ධතියක් ඔස්සේ ගෙවීම ආරම්භ කරනු ලැබුවේ ඒ අනුවයි. විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය සඳහා මධ්‍යම දත්ත පද්ධතිය භාවිතා කිරීම සිදුකරන ලදී. එහිදී දෙපාර්තමේන්තුවේ ප්‍රධානත ම අභියෝගය වූයේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් සමඟ තොරතුරු හුවමාරු කරගැනීම සිදු කළයුත්තේ කෙසේද යන්න පිළිබඳවයි. එහි දී ඒ වනවිටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත ලබා දී තිබූ ජාලගත සම්බන්ධය තවදුරටත් වැඩිදියුණු කර සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හා ප්‍රධාන කාර්යාලය සමග ජාලගතව එක ම ආයතනයක් බවට කටයුතු කිරීම දක්වා තොරතුරු පද්ධතිය වැඩිදියුණු කරන ලද අතර, එය දෙපාර්තමේන්තුව ලබාගත් ඓතිහාසික ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැකි ය.

මන්දයත් එම ක්‍රියාවලියේදී සියලු ම දිස්ත්‍රික් කාර්යාලයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් දැනුම්වත් කිරීම සිදුකරන ලද්දේ ජාලගත පද්ධතිය ඔස්සේ වන අතර web conferencing යන ක්‍රමවේදය දෙපාර්තමේන්තුව තුළ ප්‍රථමවරට භාවිතා කරන ලදී.

මෙම ක්‍රමවේදය මගින් මාසිකව ගෙවීමේ පද්ධතියට එකතුවන විශ්‍රාමිකයින් සහ එහි නිරවද්‍යතාවය පිළිබඳ පූර්ණ දැනුම්වත් කිරීමක් ඇති කර ගැනීමට හැකියාව උදාවිය. ගෙවීම් කටයුතු සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත නිදහස් කළ යුතු මුදල් ප්‍රමාණය ඉතා නිවැරදි ලෙස නිශ්චය කරගැනීමේ හැකියාව දෙපාර්තමේන්තුව සතු විය. ගිණුම් කටයුතු සහ මූල්‍ය වාර්තා වඩාත් නිවැරදි ලෙස පිළියෙල කරගැනීමේ හැකියාව ද මේ සමඟ ඇති විය.

## 4.4 වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රතිසංවිධානය

වැන්දඹු හා අනත්දරු ගෙවීම් කිරීමේදී පැවති ක්‍රමවේදය වූයේ යම් විශ්‍රාමිකයකු මියගිය විට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ලියකියවිලි වැන්දඹුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත භාරදීමෙන් අනතුරුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාළ වැන්දඹු ගොනුව දෙපාර්තමේන්තුවට ගෙන්වා ගැනීමයි. අනතුරුව, ප්‍රාදේශීය ලේකම් විසින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමයි. මෙය විශාල කාල පරාසයක් ගතවන දීර්ඝ ක්‍රියාවලියක් විය. මේ හේතුවෙන් විශාල වශයෙන් හිඟ වැටුප් ගෙවීමේ අවශ්‍යතාවය පැන නැගුණි.

ප්‍රස්තාර 20




බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීමේදී එකම අංකය නිකුත් කිරීම හේතුවෙන් විශ්‍රාමිකයන් හඳුනාගැනීම හා කළමනාකරණයේදී ගැටලු රාශියක් පැනනගින බව නිරීක්ෂණය වී තිබුණි. එබැවින්, වැන්දඹු අනත්දරු ගෙවීම් ක්‍රියාවලිය සංශෝධනය කිරීම කඩිනමින් කිරීමේ අවශ්‍යතාවයක් මතු විය.

ඒ සඳහා උපදෙස් නිකුත් කරමින් 6/2015 චක්‍රලේඛය නිකුත් කරන ලදී. එමගින් හඳුන්වාදෙන ලද ක්‍රමවේදය අනුව මියගිය විශ්‍රාමිකයින්ගේ දත්ත මාසිකව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් අනුව දෙපාර්තමේන්තුවේ මධ්‍යගත ජාල පද්ධතියේ නිරූපනය කරනු ලබයි.

වගුව 20

| මාසය | වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් |
|---|---|
| ජනවාරි | 136612 |
| පෙබරවාරි | 171960 |
| මාර්තු | 174804 |
| අප්‍රේල් | 180829 |
| මැයි | 181056 |
| ජූනි | 181704 |
| ජූලි | 182053 |
| අගෝස්තු | 182127 |
| සැප්තැම්බර් | 182026 |
| ඔක්තෝම්බර් | 181923 |
| නොවැම්බර් | 182054 |
| දෙසැම්බර් | 181942 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

ඒ අනුව අදාළ වැන්දඹුව විසින් ඉදිරිපත් කරනු ලබන විවාහ සහතික, මරණ සහතික සහ අනෙකුත් ගණනය කිරීම් පිළිබඳ තොරතුරු පරිලෝකනය (scan) කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් විසින් ජාලගත සම්ප්‍රේෂණය හරහා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි. දිවයිනේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ජාලගතව එකම පද්ධතියක සජීවීව (real time connectivity) සම්බන්ධ වේ. එම හැකියාව උපයෝගී කරගනිමින් වැන්දඹු අනත්දරු ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිසංවිධානය කිරීමට 2015 වසරේ දී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකි විය.

ඒ අනුව වැන්දඹු අනත්දරු ලියාපදිංචිකිරීම් තවත් පහසු කර විශ්‍රාමිකයා මියගිය මාසයට පසු මාසයේ සිට ම වැන්දඹුවට / වැන්දඹු පුරුෂයන්ට හා අනත්දරුවන්ට වැන්දඹු අනත්දරු ක්‍රමය සඳහා ලියාපදිංචි කර ගෙවීම් කිරීමට අවශ්‍ය පහසුකම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හරහා වෙන වෙන ම පරිගණක තොරතුරු පද්ධතියක් හරහා ලබාදිය හැකි ය. මෙමගින් අදාළ වැන්දඹුවගේ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබුණු විට ම තොරතුරු ලියාපදිංචිය මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online) මගින් සිදුකළ හැකි වීය.

**ප්‍රස්තාර 21**

**වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් - 2015**

මුදල මිලි.




**වගුව 21**

| මාසය | මධ්‍යම රජය | පළාත් සභා |
|---|---|---|
| ජනවාරි | 777 | 252 |
| පෙබරවාරි | 856 | 375 |
| මාර්තු | 848 | 381 |
| අප්‍රේල් | 798 | 362 |
| මැයි | 709 | 523 |
| ජුනි | 822 | 482 |
| ජූලි | 817 | 424 |
| අගෝස්තු | 818 | 393 |
| සැප්තැම්බර් | 844 | 547 |
| ඔක්තෝම්බර් | 807 | 409 |
| නොවැම්බර් | 868 | 363 |
| දෙසැම්බර් | 650 | 650 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

මෙම නව ක්‍රමවේදය මගින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ලියාපදිංචි ක්‍රියාවලිය ඉතා අඩු කාලයක් තුළ අවම පිරිවැයකින් වඩා විශ්වසනීයව සිදු කිරීමට වඩාත් ඵලදායී තත්ත්වයකි. මෙකී ක්‍රියාවලිය මගින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය නැති වූ අතර, ඒ හේතුවෙන් හිඟවැටුප් ගෙවීම් අවම කරගැනීමට ද හැකියාව ලැබුණි. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය නිකුත් කිරීම දෙපාර්තමේන්තුව මගින් මධ්‍යගතව සිදු කිරීමට ද අවකාශ උදා විය.

**ප්‍රස්තාර 22**

**වැන්දඹු සහ අනත්දරු දායක මුදල් ලැබීම්**
**2014 -2015**

රු.මිලි




**වගුව 22**

| මාසය | 2014 | 2015 |
|---|---|---|
| ජනවාරි | 1266.824374 | 1029 |
| පෙබරවාරි | 1107.847023 | 1231 |
| මාර්තු | 1261.389498 | 1229 |
| අප්‍රේල් | 1188.788255 | 1160 |
| මැයි | 1266.320817 | 1232 |
| ජුනි | 1136.882004 | 1304 |
| ජූලි | 1235.211686 | 1241 |
| අගෝස්තු | 1213.494276 | 1211 |
| සැප්තැම්බර් | 1220.022903 | 1391 |
| ඔක්තෝම්බර් | 1223.696408 | 1216 |
| නොවැම්බර් | 1213.965169 | 1231 |
| දෙසැම්බර් | 1599.70861 | 1300 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

ප්‍රස්තාර 23




වගුව 23

| මාසය | බස්නාහිර | දකුණ | මධ්‍යම | ඌව | සබරගමු | වයඹ | උතුරුමැද | උතුර | නැගෙනහිර |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 761 | 410 | 962 | 264 | 341 | 19 | 165 | 366 | 276 |
| පෙබ | 103 | 486 | 972 | 224 | 167 | 548 | 128 | 300 | 380 |
| මාර්තු | 835 | 477 | 995 | 328 | 756 | 497 | 268 | 312 | 229 |
| අප්‍රේල් | 835 | 824 | 565 | 352 | 371 | 518 | 255 | 335 | 724 |
| මැයි | 835 | 133 | 523 | 746 | 178 | 515 | 260 | 316 | 364 |
| ජුනි | 835 | 262 | 447 | 351 | 105 | 102 | 254 | 329 | 364 |
| ජුලි | 835 | 579 | 538 | 342 | 263 | 198 | 544 | 333 | 751 |
| අගෝස්තු | 835 | 460 | 539 | 789 | 734 | 506 | 273 | 325 | 376 |
| සැප් | 835 | 606 | 552 | 346 | 741 | 104 | 275 | 331 | 386 |
| ඔක් | 835 | 474 | 552 | 687 | 228 | 526 | 278 | 321 | 377 |
| නොවැ | 835 | 103 | 161 | 343 | 235 | 231 | 287 | 333 | 391 |
| දෙසැ | 835 | 476 | 911 | 681 | 115 | 117 | 549 | 326 | 385 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

එමගින් එකම අංකය ද්විත්ව නිකුත් කිරීම ද වැලකුණු අතර, අනුපිළිවෙලින් අංක නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත විය. මේ මගින් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් සහ උරුමකරුවන් අතර සිදුවන අනවශ්‍ය ලිපි ගණුදෙනු අවම කරගැනීමට අවස්ථාව උදා විය.

## 5. ක්‍රම සංවර්ධනය හා නවීකරණය

### 5.1 වැන්දඹු අනත්දරු හිමිකම් ලියාපදිංචි කිරීම

වැන්දඹු අනත්දරු හිමිකම් පිළිගන්වනු ලබන්නේ විශ්‍රාමිකයා මියගිය අවස්ථාවන්හිදී වන අතර, මෙම ක්‍රියාවලියේ ඇති සංකීර්ණතාවය නිසා ම බොහෝ පරිපාලන ගැටලු වලට මුහුණදීමට සිදුවන බව නිරීක්ෂණය කරගත හැකිවිය. වැන්දඹු අනත්දරු අංකයක් ලබාගැනීම අතපසුවීමෙන් හෝ වැන්දඹු අනත්දරු ලිපිගොනුව නිසි කාලවේලාවන් වලදී යාවත්කාලීන නොවීමෙන් මෙම තත්ත්වයන් නිර්මාණය වී ඇති බව ද නිරීක්ෂණය කරන ලදී.

තවද වැන්දඹු අනත්දරු අංකය ලබාදීම සහ ලබාගැනීමේ ක්‍රියාවලිය තුළ තිබූ අඩුලුහුඩුකම් නිසා එම අංකය ලබා නොගත් අය සිටි බව ද වාර්තා විය.

එම තත්ත්වයන් නිසා මතුවන දුෂ්කරතාවයන් වළක්වාගැනීමේ අරමුණින් ඕනෑම පුද්ගලයෙකුට තම වැන්දඹු අනත්දරු අංකය ලබාගැනීමේ ක්‍රියාවලිය අන්තර්ජාලය හරහා සිදුකිරීමට මෙම වසර තුළදී අවස්ථාව සලසාදෙනු ලැබී ය.

එමගින් ඉතා සරලවත්, පහසුවත් සිය අංකය ලබාගැනීමට හැකියාව ලැබුණු අතර, ක්ෂණයකින් විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට පිවිසී හිමිකරුවන්ට සිය ගැටලුවලට විසඳුම් ලබාගැනීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද සුවිශාල ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය.

### 5.2 වෙබ් අඩවිය නවීකරණය කිරීම

දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් භාවිත කරන ලද වෙබ් අඩවිය පරිශීලනයට පහසුවීම සහ විශ්‍රාමික තොරතුරු වඩාත් හොඳින් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි නවීකරණය කිරීම මෙම වසරේ දී සිදු කරන ලද ප්‍රධානතම කාර්යයක් විය. ඒ අනුව වෙබ් අඩවිය

නවීකරණය කරමින් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලු ක්‍රියාකාරකම් පිළිබඳව සමස්ත ප්‍රජාව දැනුම්වත් වන පරිදි දෙපාර්තමේන්තුව සමග රාජ්‍ය හා පෞද්ගලික අංශවල දායකත්වය පිළිබිඹු වන පරිදි තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

වෙබ් අඩවිය නවීකරණය කර මාස 05ක් ගතවීමට පෙර ලක්ෂ 12කට අධික ප්‍රමාණයක් වෙබ් අඩවිය පරිශීලනය කිරීම තුළින් එහි සාර්ථක බව සනාථ වී ඇත. ඉදිරියේදී මෙය තවදුරටත් නවීකරණය කිරීමට හා භාවිත මිතුරු පද්ධතියක් ඇති කිරීමට (user friendly) සැලසුම් සකස් කර ඇත.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

එමෙන් ම විශ්‍රාමික ප්‍රජාව විසින් විමසීම් කරන ගෙවීම් තොරතුරු ඉතිහාසය, ලියාපදිංචි තොරතුරු බැංකුගත කිරීම් තොරතුරු ආදිය ලබා ගැනීමට හැකියාව ඇත. තව ද විශ්‍රාමිකයන් වෙනුවෙන් බැංකු පද්ධතිය විසින් ලබා දෙන ණය යෝජනා ආදියෙහි තොරතුරු පරීක්ෂාව සඳහා ද වෙබ් අඩවියේ මෙකී ගෙවීම් තොරතුරු බැංකු විසින් අදාල කර ගන්නා බව දක්නට ලැබේ. තව ද ලිපි ගණුදෙනු වෙනුවට වෙබ් අඩවියේ සිදු කෙරෙන පළ කිරීම් මගින් එකවර සියලු ප්‍රජාව වෙත තොරතුරු සන්නිවේදනය කිරීමට හැකියාව ලැබී ඇත. තව ද පැය විසිහතර පුරා ක්‍රියාත්මක නොනිදන කාර්යාලයක් ලෙස මේ වෙබ් අඩවියෙන් ඕනෑම අයෙකුට හෝ ආයතනයකට තොරතුරු ලබා ගැනීමේ පහසුකම සපයා ඇත.

## 5.3 ලේඛනාගාර නවීකරණය

විශ්‍රාමිකයින්ගේ සහ අනාගතයේ විශ්‍රාම ගැනීමට අපේක්ෂිත පුද්ගලයන්ගේ ලේඛන ආරක්ෂා කරමින් නඩත්තු කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතු වැදගත් කාර්යභාරයකි. ඒ සඳහා දෙපාර්තමේන්තුව විශාල අවකාශයක් සහ අදාල ප්‍රමාණයට කාර්ය මණ්ඩලයක් වෙන් කර ඇත. මේ වනවිට විශ්‍රාම වැටුප් ලබන සියලුම විශ්‍රාමිකයන්ගේ ලිපිගොනු ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඒ සඳහා වෙන් කොට ඇති අවකාශයන්හි සුරක්ෂිතව පවතී. 2015 වසර තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක ලේඛනාගාර නවීකරණයකොට ඇති අතර, එම ලේඛන ආරක්ෂා කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ද දියත් කර ඇත.

ඒ අනුව ලේඛන කළමනාකරණය සඳහා විශේෂ වැඩසටහනක් ලෙස පරිලෝකනය කිරීමේ ක්‍රියාවලිය මේ වනවිටත් අරඹා ඇති අතර, ඉදිරි වසරේ දී එය තවදුරටත් ව්‍යාප්ත කරනු වස් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු කටයුතු නවීකරණය කරමින් දත්ත හා තොරතුරු පරිශීලනය කිරීමේ හැකියාව වර්ධනය කරනු ඇත.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 5.4 විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම

වසර 2006 දී රාජ්‍ය සේවාවේ සිදු කරන ලද වැටුප් සංශෝධනයන් යටතේ 2006ට පෙර විශ්‍රාම ලැබූ විශ්‍රාමිකයන්ට හිමි ප්‍රතිලාභ ගෙවීම් පෙර වසර 10ක කාලයක් ඔස්සේ විෂමතාවන්ට ලක් වූ සියලු විශ්‍රාමිකයන්ගේ ඉල්ලීම් අනුව 2015 ජූනි 30 දින සිට එම විෂමතා ඉවත් කර වැටුප් සැකසීමට නව රජය තීරණය කරන ලදී.

මේ අනුව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කරන ලද අතර එයට සමගාමීව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් වලට උපදෙස් ලබාදෙන ලදී.

**ප්‍රස්තාර 24**




මේ අනුව සමස්ත විශ්‍රාම වැටුප් හිමි 360,000 අධික ප්‍රතිලාභීන්ට විශ්‍රාම වැටුප් ලබාදීමේ අභියෝගය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හමුවේ විය.

මේ සඳහා විශේෂ කාර්ය පටිපාටියක් අනුගමනය කරමින්, මෙම කාර්යය සඳහා විශේෂ පරිගණක වැඩසටහන් සැලසුම් කර තව ද එම ක්‍රියාවලිය කඩිනම් කිරීමට මානව සම්පත් වැඩිදියුණු කිරීම් සිදුකරන ලදී.

**වගුව 24**

| මාසය | වැටුප් විෂමතා ඉවත් කළ සංඛ්‍යාව |
|---|---|
| ජූලි | 156082 |
| අගෝස්තු | 97372 |
| සැප්තැම්බර් | 23827 |
| ඔක්තෝම්බර් | 14516 |
| නොවැම්බර් | 10332 |
| දෙසැම්බර් | 5583 |

මූලාශ්‍රය - විශ්‍රාම වැටුප් විශමතා අංශය

එම අවස්ථාව රාජ්‍ය සේවයේ සුවිශේෂී අවස්ථාවක් වූ අතර, සියලු ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් මගින් අන්තර්ජාලය ඔස්සේ පාලනය කරමින් එසැණින් (real time) දත්ත හුවමාරු කිරීම සිදුකරනු ලැබිණ. මේ අනුව, නව රජය විසින් දෙපාර්තමේන්තුවට ලබාදුන් අභියෝගය මසක් ඇතුළත ඉටුකිරීමට හැකියාව ලැබුණි.

**ප්‍රස්තාර 25**



වගුව 25

| | |
|---|---|
| අවසන් කිරීමට තිබුනු ලිපි ගොනු ප්‍රමාණය | 348214 |
| අවසන් කළ ලිපි ගොනු ප්‍රමාණය | 314262 |
| ඉතිරිව තිබෙන ලිපි ගොනු ප්‍රමාණය | 21493 |
| අවසන් කිරීමට තිබුනු ලිපි ගොනු ප්‍රමාණය | 348214 |

මූලාශ්‍රය - විශ්‍රාම වැටුප් විශමතා අංශය

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේ සඳහා ඉටු කරන ලද කැපකිරීම මෙහිලා සටහන් කරනුයේ ඔවුන්ට දක්වන ගෞරවයක් ලෙසිනි. ඒ වෙනුවෙන් රු. බිලියන 16ක පමණ අතිරේක ප්‍රතිපාදන ලබාදීමට රජයට සිදු වූ අතර, මහා භාණ්ඩාගාරය එම ප්‍රතිපාදන කඩිනමින් ලබා දීමට පියවර ගැනීම අපට මහත් ශක්තියක් විය. මෙමඟින් මගින් විශ්‍රාමික ප්‍රජාව තුළ වසර 10ක් තුළ පැවති අවිනිශ්චිත බව තුරන් වී විශ්වාසනීයත්වය තහවුරු විය.

ප්‍රස්තාර 26




වගුව 26

| අවසන් කළ ලිපි ගොනු ප්‍රමාණය | වියදම් වූ මුදල මිලි. |
|---|---|
| 314262 | 1581.00 |

මූලාශ්‍රය - විශ්‍රාම වැටුප් විශමතා අංශය

## 6. මූල්‍ය සමාලෝචනය.

විශ්‍රාමික රාජ්‍ය නිලධාරින්ගේ සමාජ සුරක්ෂණය සැලසීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය එම අරමුණ සාක්ෂාත් කිරීම සඳහා වාර්ෂිකව විශාල ආයෝජනයක් කරනු ලබයි. 2015 වර්ෂය අවසානයේදී සමස්ත විශ්‍රාමික ගහණය 560,000 ක් ඉක්ම විය. සිවිල්,හමුදා සහ වැන්දඹු විශ්‍රාම වැටුප් යන ත්‍රිවිධ වර්ගකීරණය නියෝජනය කරනු ලබන විශ්‍රාමිකයින්ගෙන් මෙය සමන්විත වේ. රටේ සමස්ත ආදායමෙන් 12% ආසන්න මුදලක් විශ්‍රාම වැටුප් ගෙවීම වෙනුවෙන් රජය දරණ අතර, එය රටේ දළ දේශිය නිෂ්පාදනයෙන් 1.8% ආසන්න අගයක් ගනී. විශ්‍රාම වැටුප් සඳහා දරණ වියදම ආර්ථිකමය වශයෙන් රජයට වැය බරක් වුවත්, එමඟින් ආර්ථිකමය ප්‍රතිලාභයක් නැවත රජයට නොලැබේ. විශාල සමාජ මෙහවරක් කරමින් අවුරුදු 30කට ආසන්න කාලයක් තම ශ්‍රමය කැප කරමින් රටේ සංවර්ධනයට උරදුන් රජයේ නිලධාරින්ගේ සමාජ සුරක්ෂිත භාවය සඳහා මෙම වැයබර රජය විසින් දැරීම අත්‍යවශ්‍ය වන බැවින් වාර්ෂික අයවැයෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි.

විශ්‍රාමික ප්‍රජාවගේ උපනතිය සැලකූ විට අඛණ්ඩ වර්ධනයක් දැකිය හැකි ය. වාර්ෂිකව 20,000කට ආසන්න විශ්‍රාමිකයින් සංඛ්‍යාවක් විශ්‍රාමික ගහණයට එකතුවීමත් සමඟ විශ්‍රාම වැටුප් වියදමේ ද අඛණ්ඩ වර්ධනයක් දැකිය හැකි ය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයත් සමඟ විශ්‍රාමිකයින්ගේ ආයුකාලය වැඩි වීමද විශ්‍රාමික ගහණයේ අඛණ්ඩ වර්ධනය ඉහළ යාමට හේතු වී ඇත.

2015 වර්ෂයේ ආරම්භයේ දී මාසික විශ්‍රාම වැටුප් වියදම රු.මිලියන 10984 ක් වූ අතර 2015 වර්ෂය අවසානයේ දී එය රු.මිලියන 13123 සිට රු.මිලියන 2139 දක්වා ඉහළ යන ලදි. එහි වර්ධනය 19.5කි. 2015 වර්ෂයේදී විශ්‍රාමික සංඛ්‍යාව වර්ධනය වීමට

අමතරව 2006/06 විශ්‍රාම වැටුප් විෂමතාවය ගැළපීම විශ්‍රාම වැටුප් වියදම වැඩි විමට හේතු විය. 2006/06 විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරිම හේතුවෙන් විශ්‍රාම වැටුප් වියදම මාසිකව මිලියන 1200කින් පමණ වර්ධනය වී තිබිණි. 2015 වර්ෂයේ ආරම්භයේ සිටි විශ්‍රාමික සංඛ්‍යාව 547,844 වු අතර වර්ෂය අවසානයේදි 560,462 දක්වා වර්ධනය වීමක් සිදු වී ඇත. එහි ශුද්ධ වැඩි විම සංඛ්‍යාත්මකව 12,618 ක් වු අතර වර්ධනය 2.3 කි. මෙය විශ්‍රාම ගහණයේ ශුද්ධ වර්ධනයයි. (මියගිය සංඛ්‍යාව සමඟ සැසදීමේ දී) 2015 වර්ෂයේදි විශ්‍රාමික ගහණයට එකතු වු නව විශ්‍රාමිකයින් සංඛ්‍යාව 19,795 කි. 2014 වර්ෂය තුළ දී 7100ක් පමණ විශ්‍රාමිකයින් මියගොස් ඇත.විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම සඳහා වාර්ෂිකව දරනු ලබන වියදම වියදම වර්ධනය වීමක් දැකිය හැක. 2012 වර්ෂයේ මිලියන 110,617ක් 2013 වර්ෂයේ රු.මිලියන 122,766 ක් 2014 වර්ෂයේ රු.මිලියන 126,103 ක් 2015 වර්ෂයේ රු.මිලියන 154,956 ක්ද විය. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදි 11% ඒ අනුව 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදි 2.7%කින්ද 2015 වර්ෂයේ දි 2014 වර්ෂයට සාපේක්ෂව 22% වර්ධනයක් දැකිය හැකි ය.

**ප්‍රස්තාර 27**




**වගුව 27**

| වර්ෂය | වියදම රු. |
|---|---|
| 2012 | 110617 |
| 2013 | 122766 |
| 2014 | 126103 |
| 2015 | 154956 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

මෙලෙස අඛණ්ඩව වර්ධනය වන විශ්‍රාම වැටුප් වැය බර සැහැල්ලු කර ගැනිමේ විකල්ප ක්‍රමෝපායන් වෙත අවධානය යොමු නොකළහොත් අනාගතයේදි එය ආර්ථිකයට දරාගත නොහැකි වන බව නොඅනුමාන ය.

විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මාසිකව මහ භාණ්ඩාගාරය නිදහස් කරන මිලියන 16,000 ආසන්න අතිවිශාල මුදල් ප්‍රමාණය ආර්ථිකමය වශයෙන් ප්‍රතිලාභ ගෙන දිය හැකි ආයෝජන මාර්ගයන්හි යෙදවිය හැකි මුදල් ප්‍රමාණයකි.මෙම මුදල් ප්‍රමාණය කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් මඟින් ජනිත නොවන අතර හුදෙක් එය රජය විසින් භාණ්ඩාගාර බැඳුම්කර මත සපයා ගන්නා ණය මගින් සැපයිම නිසා විශ්‍රාම වැටුප් වැය අනාගතයේදි ආර්ථිකයට අනවශ්‍ය බරක් නොවන විකල්ප ක්‍රමවේදයකින් සපුරා ගැනිමට අවධානය යොමු කළ යුතු කාලය එළැඹී ඇත.

## 7. සත්කාර පියස

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ දුර්වලතා වන අදාළ විශ්‍රාමිකයා තහවුරු කර ගැනීම පිළිබඳව තිබූ අවිනිශ්චිතතාවය හා රාජ්‍ය මුදල් අවභාවිතය ජය ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද සුවිශේෂී ඒකකය වන්නේ සත්කාර පියස යි. විශේෂයෙන් ම විශ්‍රාම වැටුප් හිමිකම ලබන ප්‍රතිලාභියා හඳුනා ගැනීම හා විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ අවදානම් සහගත බව හඳුනාගැනීමට දෙපාර්තමේන්තුවට කාලයක් ගත විය.

මේ අනුව විශ්‍රාම වැටුප් හිමිකම්ලාභියා නිවැරදිව හඳුනාගැනීම විශේෂ කටයුත්තක් වන අතර, විශ්‍රාම වැටුපට අමතරව දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික ප්‍රජාව වෙත හඳුන්වා දී ඇති සේවාවන් රාශියක් පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමේ කාර්යභාරය ද මේ ක්‍රියාවලියට ඇතුළත් විය. දැනට ලංකාවේ ඉදිරියෙන්ම සිටින පෞද්ගලික ආයතන මෙන් ම රාජ්‍ය හා පෞද්ගලික අංශය ද මේ සඳහා අනුග්‍රාහකත්වය ලබා දෙයි.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

මේ අනුව ඉදිරි වසරේ සිට මෙම ක්‍රියාවලිය විශ්‍රාම වැටුප් ගෙවීමට පෙර සිදු කිරීමට දෙපාර්තමේන්තුව දැනටමත් තීරණය කර ඇත. මෙහිදී විශ්‍රාමිකයා විශ්‍රාම ගැනීමට පෙර දෙපාර්තමේන්තුවෙහි විශේෂ නිලධාරීන් සමඟ එකිනෙකා මුණගැසෙන සුහද හමුවක් සිදු වන අතර, එමගින් විශ්‍රාමිකයාගේ ශක්තීන් හඳුනාගැනීමට හා ඔහුට ලැබෙන හිමිකම් සහතික කිරීම සිදු වන අතර ම, ඔහු නැවත සමාජයේ ක්‍රියාශීලී පුද්ගලයකු වශයෙන් විශ්‍රාමික දිවිය සතුටින් ගෙවීමට අවශ්‍ය මාර්ගෝපදේශයන්ලබාදීමටත් දෙපාර්තමේන්තුව කටයුතු කරනු ඇත. ඉදිරියේදී විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පිළිගැන්වීමට පෙර මෙම ක්‍රියාවලිය ශක්තිමත් කිරීමටත් රටේ පිළිගත් ආයතන සමග එකාබද්ධව කටයුතු කිරීමටත් අවස්ථාව උදා කරනු ඇත. මේ අනුව ඉදිරියේදී විශ්‍රාම ලබන සියලුම විශ්‍රාමික ප්‍රතිලාභීන් සත්කාර පියසේ දී මුහුණට මුහුණ මුණගැසී සාකච්ඡා කරනු ඇත.මේ ක්‍රියාවලියේ විශේෂත්වය වනුයේ දෙපාර්තමේන්තුවෙහි දත්ත පද්ධතියට විශ්‍රාමිකයාගේ තොරතුරු සහ ඔහුගේ වැන්දඹු අනත්දරු ආබාධිත හිමිකම් ලබන පුද්ගලයා පිළිබඳව නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට අවකාශ සැලසීමයි. මෙහිදී අනාගතයේදී විශ්‍රාමික ප්‍රතිලාභියාගෙන් පසු ප්‍රතිලාභ හිමිකම් සහිත කිසිදු උරුමකරුවෙකුට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හෝ අනෙකුත් කිසිදු රාජ්‍ය ආයතනයකට නොයා එම ක්‍රියාවලිය ස්වයංක්‍රීයව සිදු කරවා ගැනීමට හැකි වනු ඇත.

එමඟින් විශ්‍රාමිකයාට ගෞරවාන්විතව ප්‍රතිලාභ ලැබීමට හැකිවීම මඟින් ඔහුගේ ජීවිතය සැපවත් කරගැනීමට අවස්ථාව උදාවන බව අපගේ විශ්වාසයයි. තවද, දෙපාර්තමේන්තු ව හඳුන්වා දී ඇති නව හැඳුනුම්පතට අවශ්‍ය නිවැරදි දත්ත ලබාගෙන ඒවා ගබඩා කිරීමෙන්, ඉදිරියේදී පරිගණක ක්‍රියාවලිය හා සම්බන්ධවීමට අවස්ථාව සැලසීම ද මෙහි දී සිදුවේ.

කෙසේ වුවත් මෙම ක්‍රියාවලිය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම් අනුමත කරන ආයතනවල කාර්යභාරය අවසන් නොවන අතර විශ්‍රාමිකයාට ප්‍රදාන පත්‍රය නිකුත් කිරීමේ වගකීම ඔවුන් වෙත පවරා ඇත. පසුගිය වසරවල දෙපාර්තමේන්තුව කළ නිරීක්ෂණවලින් පෙනී යන්නේ එම ප්‍රදාන පත්‍ර පිළිගැන්වීමේ ක්‍රියාවලිය තවදුරටත් ප්‍රමාද වන බවයි. එබැවින් දෙපාර්තමේන්තුව තුළ ඒ සඳහා විශේෂ ඒකකයක් පිහිටුවා එකී ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 8. විශ්‍රාම වෙබ් ගුවන් විදුලිය

විශ්‍රාමික ප්‍රජාව නැවත වරක් සමාජගත කිරීමේ කාර්යයන් රැසක් ඇරඹීමට 2015 වසර තුළදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකිවිය. එහි ප්‍රමුඛ කාර්යයක් ලෙස 2015 ඔක්තෝබර් 08 දිනට යෙදී තිබූ ජාතික විශ්‍රාම වැටුප් දිනයේදී විශ්‍රාම වෙබ් ගුවන් විදුලිය ආරම්භ කිරීමට හැකි විය.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ලැබූ නිලධාරීන්ගේ සම්පත් දායකත්වය ලබාගනිමින් ඇරැඹි විශ්‍රාම වෙබ් ගුවන්විදුලිය ඔස්සේ විශ්‍රාමික ප්‍රජාව සතු දැනුම, කුසලතා සහ අත්දැකීම් නැවත සමාජගත කිරීමටත් ඔවුනට දැනුම හා තොරතුරු මෙන්ම මානසික තෘප්තිය ළඟා කර දීමටත් හැකි වී තිබේ.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 9. විශ්‍රාම "ඉ" සඟරාව

සාහිත්‍ය, ආර්ථික, සමාජීය, නිර්මාණාත්මක, සෞඛ්‍ය ආදී ක්ෂේත්‍රයන් පිළිබඳව ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සතුව පවත්නා දැනුම් සම්භාරයන් එකට කැටිකොට ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක මාධ්‍ය සන්දේශයක් ලෙස අන්තර්ජාලය ඔස්සේ සමාජගත කිරීම විශ්‍රාම "ඉ" සඟරාවේ අරමුණ විය. වයස් භේදයකින් තොරව පරිශීලනය කළ හැකි සාර සංග්‍රහයක් වන මෙය විශ්‍රාම වැටුප් ක්‍රියාවලින්හි වෙනස්කම් සහ ශාස්ත්‍රීය දැනුමක් ලබා ගත හැකි පරිදි සැකසී ඇත. තම සැඳැසමය ගත කරන දේශීය මෙන්ම විදේශයන් හි වාසය කරන විශ්‍රාමිකයන්ගේ ද ප්‍රශංසනාත්මක ප්‍රතිචාර මේ වනවිටත් විශ්‍රාම 'ඉ' සඟරාවට ලැබී ඇති බව සාඩම්බරයෙන් ප්‍රකාශ කළ හැකි ය.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 10. ජාතික විශ්‍රාමික දින සැමරුම

මෙරට රාජ්‍ය සේවයේත්, ප්‍රජාවගේත් ප්‍රගමනය උදෙසා ජීවිතයේ වැඩි කාලයක් දැනුම, කුසලතා, කාලය හා ශ්‍රමය කැප කර විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවක විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් ජාතික දිනයක් ලෙස ඔක්තෝබර් 08 වැනි දිනය නම් කෙරෙනුයේ 2007 වසරේදී ය. එකී දිනය විශ්‍රාමික ප්‍රජාවගේ සේවය ඇගයීම සඳහා වූ තවත් එක් දිනයක් බවට පත් නොකර ඔවුන් වෙත ගෞරවණීය සමාජ හා ආර්ථික වටපිටාවක් උදෙසා කටයුතු දියත් කෙරෙන දිනයක් ලෙස නව අරුත් එක් කරමින් සමස්ත විශ්‍රාමික ප්‍රජාව දේශපාලනාධිකාරිය, රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශයේ දැවැන්ත ව්‍යවසායකයන්, උගතුන් හා ගවේෂකයන් එක් කරගනිමින් 2015 වසර ජාතික විශ්‍රාමික දිනය අභිමානයෙන් සමරන ලදී.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමා, ගරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා, ගරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍ය සුසන්ත පුංචිනිළමේ මැතිතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල පැවැත්විණි. මීට අමතරව 2015 ඔක්තෝබර් 01 සිට 07 දක්වා සතියක කාලය දිස්ත්‍රික් ලේකම් කාර්යාල කේන්ද්‍ර කරගනිමින් දීප ව්‍යාප්ත වැඩසටහන් ක්‍රියාත්මක විය. සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් කථිකාවක් ඇතිකිරීම උදෙසා " ජාතික විශ්‍රාමික ප්‍රතිපත්තියක් " යන මැයෙන් ජාත්‍යන්තර සමුළුවක් ද ජාතික උළෙලට සමගාමීව පැවැත්විය.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

එහිදී මැලේසියානු රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ඇතුළු දෙස් විදෙස් විද්වතුන් රැසක් සමාජාරක්ෂණ ක්‍රමයක් ලෙස ජාතික විශ්‍රාම ප්‍රතිපත්තියක් හඳුන්වාදීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. එහිදී රාජ්‍ය නිලධාරීන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන්, පර්යේෂකයන්, විශ්‍රාමික සංගම් නියෝජිතයන් හා ජනමාධ්‍යවේදීන් ද අදහස් දක්වන ලදී.

තවද, මීට සමගාමීව " විශ්‍රාම රේඩියෝ " වෙබ් ගුවන් විදුලියත්, "විශ්‍රාම ඉ" සඟරාවත් එළිදක්වන ලදී. වසර 2015 ජාතික විශ්‍රාමික දින සැමරුම සඳහා සියලු බරපැන රාජ්‍ය මුදල් භාවිතයකින් තොරව පෞද්ගලික අංශයේ සහයෝගයෙන් සිදුකිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයතන රැසක් විශ්‍රාමික ප්‍රජාව හා සමස්ත රාජ්‍ය සේවය වෙනුවෙන් එක්සත් කරගැනීමට හැකිවීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමස්ත රාජ්‍ය සේවය තුළ ම ලද දැවැන්ත ජයග්‍රහණයකි.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 11. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හා නිලධාරීන් අතර සහසම්බන්ධතාය වැඩිදියුණු කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ ජාලගතවීමත් සමඟ එම කාර්යාලයන්හි සේවය කරන නිලධාරීන්ට අදාළ තාක්ෂණික උපකරණ ලබා දෙමින් ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය විය. නූතන තාක්ෂණය භාවිතයේදී ඊට සරිලන පරිදි ආයතනික හා කාර්යාලයීය පරිසරය වැඩිදියුණු කිරීම මෙහි අරමුණ විය.

ඒ අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් සඳහා ම ලැප්ටොප් පරිගණකයක්, පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් හා පරිලෝකන (Scanner) යන්ත්‍රයක් ලබාදීම සිදුකෙරිණි.

මීට අමතරව, ශක්තිමත් ජාලගත සම්බන්ධතාවයක් තහවුරු කරලීම සඳහා අවශ්‍යජාලගත සම්බන්ධතාවයක් ද සියලු නිලධාරීන් වෙත ලබාදීම

පසුගිය වසර තුළ සිදු වූ ප්‍රධාන තාක්ෂණික වෙනස්කම් අතර කැපී පෙනෙන ක්‍රියාවලියකි.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 12. විශ්‍රාමික ප්‍රජාව ශක්තිමත් කිරීම.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් ගෙවීමෙන් ඔබ්බට ගොස් විශ්‍රාමික ප්‍රජාව වෙත සේවාවන් රාශියක් ලබා දීම තුළින් ඔවුන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම 2015 වර්ෂය තුළ දී සිදු කළ සුවිශේෂී ක්‍රියාවලියකි. රාජ්‍ය සේවයේ වසර 30කට අධික කාලයක් සේවය කරමින් සිය ශක්‍යතාවන් උපරිම තලයට පත් වන විට වැඩ පරිසරයෙන් ඉවත් වන රාජ්‍ය සේවකයන් නැවත සක්‍රීය ලෙස ආර්ථික හා සාමාජීය පද්ධතියට යොමු කර ගැනීම මෙහි දී අපේක්ෂා කෙරිණි.

ඒ අනුව ලංකාවේ පුද්ගලික අංශයේ ආයතනික දායකත්වය යටතේ මොවුන් නැවත රැකියා ලෝකයට බද්ධ කිරීම, විශ්‍රාමිකයාගේ තොරතුරු ඇතුළත් රැකියා බැංකුවක් සැකසීම, අලෙවි ප්‍රවර්ධන සේවයේ පුහුණු අලෙවිකරුවන් බවට පත් කිරීම ආදී විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ විශ්‍රාමිකයන් සුළු පරිමාණ ව්‍යාපාර සඳහා යොමු කිරීම ද සිදු කරන ලදී .

### 12.1 ණය පහසුකම් ලබා දීම.

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ පුද්ගලයන් සඳහා මූල්‍ය ණය පහසුකම් ලබා නොදුන් යුගයක රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් විශ්‍රාමික ප්‍රජාව වෙත මිලියන 1.5 දක්වා ණය මුදලක් ලබා දීම සඳහා බැංකු පද්ධතිය මෙහෙයවීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි

ප්‍රස්තාර 28

විශ්‍රාමිකයන්ගේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ණය ලබා දීම 2015




වගුව 28

| බැංකුව | මුදා හැර ඇති මුදල් ප්‍රමාණය (රු.බිලියන |
|---|---|
| ලංකා බැංකුව | 6.3 |
| පැන් ඒෂියා බැංකුව | 14.4 |
| මහජන බැංකුව | 9.2 |
| ස.සංවර්ධන බැංකුව | 6.8 |
| ජා. ඉ. කිරීමේ බැංකුව | 3.3 |
| ප්‍රා. ස. බැංකුව | 2.5 |
| සම්පත් බැංකුව | 0.022 |
| සෙලාන් බැංකුව | 0.000445 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

මේ යටතේ සියලුම රාජ්‍ය හා පෞද්ගලික බැංකු එක් කර ණය පහසුකම් ලබා දීම මඟින් රු.බිලියන 55ක ප්‍රමාණයක් ආර්ථිකයට එක් කරන ලදී. මෙමඟින් විශ්‍රාමික ප්‍රජාව නැවතත් සමාජයේ පිළිගත් ව්‍යවසායකයන් කොටසක් බවට පත් කිරීම හා ඔවුන්ට සුළු ව්‍යාපාර ආරම්භ කිරීමට මඟ පෙන්වීමත් සමඟ මුදල් රට තුල සංසරණයට මඟ පෑදීමෙන් ආර්ථික වර්ධනයට ද දායකත්වයක් සැපයිය හැකි විය.

ප්‍රස්තාර 29




වගුව 29

| බැංකුව | ණය ලබාගත් විශ්‍රාමිකයන් ගණන |
|---|---|
| ලංකා බැංකුව | 20492 |
| පැන් ඒෂියා බැංකුව | 26048 |
| මහජන බැංකුව | 33555 |
| සණස සංවර්ධන බැංකුව | 12753 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 6847 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 6384 |
| සම්පත් බැංකුව | 38 |
| සෙලාන් බැංකුව | 4 |

මූලාශ්‍රය - ගිණුම් අංශය

## 12.2 දිවිඅරුණ

රාජ්‍ය සේවය තුළ වසර 30ක් පමණ සේවය කිරීමෙන් අත්දැකීම් ලැබූ පරිපූර්ණ විශ්‍රාමික ප්‍රජාවගේ කුසලතා ඔප් නැංවීම මෙහි අරමුණයි. මේ යටතේ විශ්‍රාමිකයන් නැවත රැකියා සඳහා පුහුණු කිරීම හා පුද්ගලික අංශය වෙත යොමු කිරීම ආරම්භ කර ඇත. විශ්‍රාම ලබා ඇති වෘත්තිකයන්ගේ අත්දැකීම් හා ඔවුන්ගේ කුසලතා අනුව වර්ගීකරණය කර ඔවුන්ගේ තොරතුරු රැකියා පියස වෙබ් අඩවිය මගින් ප්‍රදර්ශනය කිරීම මෙම වසරේදී ආරම්භ කරන ලදී .

එම වෙබ් අඩවිය ඔස්සේ තම සේවාවන්ට ගැළපෙන පුද්ගලයින් තෝරා ගැනීමට රාජ්‍ය හා පුද්ගලික කටයුතු කරනු ලබයි. මෙමගින් විශ්‍රාමිකයන්ට අමතර ආදායම් ලබා ගැනීම මෙන් ම යහපත් මානසික සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කර ගැනීමට හැකි වනු ඇත.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 12.3 විශ්‍රාමික රක්ෂණ (බුහුමන්)

විශ්‍රාමික ප්‍රජාවගේ සමාජ ආරක්ෂණය සහ ආර්ථික සුහසාධනය තහවුරු කිරීම සඳහා 2014 වර්ෂයේ ඇරඹි මේ රක්ෂණ ක්‍රමය රාජ්‍ය සේවාව තුළ තිබෙන අග්‍රහාර මෙන් රාජ්‍ය මැදිත්වීමෙන් තොරව පුද්ගලික අංශය හා දෙපාර්තමේන්තුව මැදිහත්වීමෙන් අරඹන ලදී. විශේෂයෙන් ම රක්ෂණ පිළිබඳ මහජනතාව තුළ පවතින ආකල්පමය බලපෑම හේතුවෙන් රක්ෂණ ලබා ගැනීම අවම වී ඇති අතර එය තවදුරටත් ව්‍යාප්ත කිරීමට 2015 වසරේ දී හැකියාව ලැබී ඇත.

## 12.4 විශේෂ අලෙවි ප්‍රවර්ධන පහසුකම්

විශ්‍රාම ලැබීමෙන් පසු සුළු හා මධ්‍ය පරිමාණ නිර්මාණ අලෙවි කරන කර්මාන්ත ආරම්භ කර ඒ සඳහා

භෞතික පහසුකම් ලබා දීමට web portal ක්‍රමය ඇති කිරීම මෙම වසරේ දී අරඹන ලදී. විශ්‍රාමිකයන් රටට වැඩදායී පුරවැසියන් ලෙස ස්ථානගත කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය.

## 12.5 විශ්‍රාමික ප්‍රජාව කොළඹ සුරැකුම්පත් කොටස්කරුවන් බවට පත් කිරීම.

විශ්‍රාම ප්‍රජාව රටේ ආයෝජන ක්‍රියාවලියට යොදා ගැනීම පෙරදැරිව කොළඹ සුරැකුම්පත් මධ්‍යස්ථානය හා එක්ව මෙම ක්‍රියාවලිය සිදු කරයි. විශ්‍රාම ගැන්වීමේ දී ලැබෙන විශ්‍රාමික පාරිතෝෂික මුදලින් කොටසක් ආයෝජනය කර සුරක්ෂිත ආයෝජනවල කොටස්කරුවන් කිරීම මෙහි අරමුණ විය . එමගින් වාර්ෂිකව විශ්‍රාම වැටුප් ලබන්නන් අතරට එක් වන 25,000 අතරින් කොටසක් රටේ ආර්ථිකයට යොමු කිරීම සහ සමාජ ප්‍රතිලාභ ලබා දීමෙන් ඔවුන්ගේ සමාජ පිළිගැනීම තවදුරටත් තහවුරු කර දීම මෙහි අරමුණයි.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 12.6 පුස්තකාල පහසුකම් සම්පාදනය

දෙපාර්තමේන්තුවට දෛනිකව පැමිණෙන විශ්‍රාමික ප්‍රජාවගේ හුදෙකලා බව මඟහැරීමට හා ආධ්‍යාත්මික මානසික ප්‍රවර්ධනය සඳහා පුස්තකාලය අරඹන ලදී. එමගින් තම සේවාව ලැබෙන තුරු පොත් පරිශීලනය, පුවත්පත්, අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට හැකි පරිදි පහසුකම් සම්පාදනය කර ඇත. ඉදිරියේදී මෙය තවදුරටත් ශක්තිමත් කිරීමට දෙපාර්තමේන්තුවෙහි අභිලාෂය වේ .



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 12.7 සේවා ජාලයක් ස්ථාපිත කිරීම

දෙපාර්තමේන්තුවට පැමිණෙන විශ්‍රාමික ප්‍රජාව උදෙසා සේවා පහසුකම් සැපයීමේ ජාලයක් දෙපාර්තමේන්තුව අභ්‍යන්තරයේ ස්ථානගත කර ඇත. බැංකු ආයතන, රක්ෂණ ආයතන, දුරකථන සේවා සපයන ආයතන සේවාවන්, බිල්පත් ගෙවීම්, වෙනත් සේවාවන් සපයන ආයතන ස්ථාන ගත කර ඇත. ඊට අමතරව, විශේෂයෙන් විශ්‍රාමිකයින් පැමිණීමේදී එම සේවාලාභීන්ගේ රුචිකත්වය අනුව තෝරාගත හැකි තේ වර්ග කිහිපයක් සහිත යන්ත්‍රයක් සපයා ඇත. ඊට අමතරව විවිධ ආයතනවලින් විශ්‍රාම දිවිය යහපත් කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් සහිත තොරතුරු ඇතුළත් පුවරු ප්‍රදර්ශනය කර ඇත.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 12.8 දැනුම්වත් කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය

රාජ්‍ය සේවකයන් විශ්‍රාම ගන්වන ආයතනයන් වන රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව, පොලීසිය මෙන් ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් , තැපැල් කාර්යාල යන්, බැංකු ජාලය වෙත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි නිරන්තරයෙන් සිදුවන වෙනස්කම් ක්ෂණිකව සම්ප්‍රේෂණය කිරීමටත්, දෙපාර්තමේන්තු ක්‍රියාවලිය ප්‍රවර්ධනය සඳහා ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීමටත් ලැබීම මෙහි ප්‍රතිඵලයන් ය. මෙවැනි අන්තර් ආයතනික සම්බන්ධතා සිරස් හා තිරස් මෙන් ම, පුළුල් පරාසයක විහිදී ගිය සම්බන්ධතාවක් පවත්වාගැනීම නූතන කළමනාකරණයේ ප්‍රමුඛ අංගයක් වී ඇත.

## 12.9 වෘත්තීය සමිති සන්ධානයන් අතර අවබෝධය පුළුල් කිරීම.

මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් යටතේ රාජ්‍ය සේවාවේ ඉතා ප්‍රබල වෘත්තීය සමිති නායකයන් දැනුම්වත් කිරීමට ලැබීම දෙපාර්තමේන්තුව අත්පත් කරගත් තවත් ප්‍රගතියකි. මෙමගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳ රාජ්‍ය සේවය හා විශ්‍රාමික ප්‍රජාව තුළ පැවති දුර්මත ඉවත් කිරීමටත් නව ප්‍රවණතාවයන් පිළිබඳ දැනුම්වත් කිරීමටත් හැකිවිය.

එමෙන් ම නව විශ්‍රාම වැටුප් ප්‍රතිපත්තියක අවශ්‍යතාව පිළිබඳ වෘත්තීය සමිති තුළ ඇති වූ අවිනිශ්චිත බව ඉවත් කිරීමට මෙවැනි සාකච්ඡාවන් තුළින් හැකි වූ බව පෙන්වා දිය හැකි ය.

# 13. ආයතනික ඵලදායීතා ප්‍රවර්ධන කටයුතු

ශ්‍රී ලංකා රාජ්‍ය සේවාවේ සේවයේ නියුතුව සිටි විශ්‍රාමික රජයේ සේවකයන් වෙත සේවා සපයන ආයතනයක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව එකී ප්‍රතිලාභීන්ගේ ගෞරවය ගොඩනැංවෙන පරිදි ආයතනික හා භෞතික පරිසරය නිර්මාණය කිරීම පිළිබඳව අවධානය යොමු කොට ඇත.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

මේ අනුව මානසික සුවය ඇතිවන පරිදි භෝග වගාවන් නඩත්තු කරමින්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සිත්දිනා ගන්නා ආකාරයට දෙපාර්තමේන්තුවෙහි භූමි අලංකරණ කටයුතු නිර්මාණය කර ඇත. ඒ ඔස්සේ සේවාදායකයන් අභිප්‍රේරණය කිරීමටත් ආයතනය පිළිබඳ සේවාදායකයන් තුළ යහපත් ප්‍රතිරූපයක් ගොඩනැංවීමටත් මහත් පිටුබලයක් සැපයෙනු ඇත. සේවාලාභීන් වෙත වැඩි වශයෙන් සේවා සපයන අංශයක් වන විශ්‍රාම වැටුප් ප්‍රදාන අංශය විශ්‍රාමිකයන් විසින් ම අඳිනලද චිත්‍ර භාවිත කරමින් අලංකාර කර ඇති අතර, ආයතනික ක්‍රියාවලියට අනුකූල වන අයුරින් නිලධාරීන් ද ස්ථාන ගත කර ඇත.

මෙකී ක්‍රියාවලිය හේතුකොටගෙන දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ධනාත්මක ප්‍රතිචාර විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත ලැබීම ඔස්සේ රාජ්‍ය සේවය පිළිබඳ නව ප්‍රවණතා සමාජය තුළ ජනිත කිරීමට පසුගියවසර තුළ හැකිවිය. තවද, දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මෙන් ම අභ්‍යන්තර නිලධාරීන්ගේ ද පහසුව සඳහා ප්‍රණීත සහ පිරිසිදු ආහාරපාන පහසු මිළ ගණන් යටතේ මිළදී ගත හැකි භෝජනාගාරයක් ස්ථාපිත කර ඇත.

අභ්‍යන්තර සේවාලාභීන්ගේ දිවා ආහාර ලබාගැනීම සඳහා සියලු පහසුකම්වලින් සමන්විත භෝජනාගාරයක් සකස් කර ඇති අතර, එම පරිසරය ද ප්‍රජා සෞඛ්‍ය උපදෙස් සපිරි පුවරුවලින් අලංකාර කොට ඔවුන්ගේ සේවයේ ගෞරවණීය බව තහවුරු කොට ඇත.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

දෙපාර්තමේන්තුවේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කර නැවත භාවිත කිරීමට හැකිවන අයුරින් සකස් කිරීමටත්, විශේෂයෙන් ' 7 R ' සංකල්පය යටතේ ආදායම් උත්පාදනය සඳහා ක්‍රමවේද සකසා ඇති අතර,මේ සඳහා පුද්ගලික අංශයේ සහයෝගය ලබාගනිමින් Green bank අංශයක් ද ස්ථාපිත කර ඇත.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

බැහැර කරන සියලුම අපද්‍රව්‍ය නවීන පාරිසරික විද්‍යාත්මක ක්‍රමවේද යටතේ කළමනාකරණය කිරීම ඔස්සේ පරිසර සංරක්ෂණ තහවුරු කිරීමෙන් අභ්‍යන්තර සේවාලාභීන් වෙත මෙන් ම දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත ද ආදර්ශ සපයන ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙස වැඩසහටන් රාශියක් ක්‍රියාත්මක වේ.

### 13.1 ඵලදායීතා ජයග්‍රහණය

2015 ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය මගින් පවත්වන ලද ජාතික ඵලදායීතා තරගාවලියේ 2014 වසර අන්තර් දෙපාර්තමේන්තු යටතේ 2 වන ස්ථානය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හිමි කර ගැනීමට අවස්ථාව උදා විය. දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේ සිට අරඹන ලද ඵලදායීතා ගමන් මගෙහි සුවිශේෂී සංධිස්ථානයක් ලෙස මෙය හැඳින්විය හැකි ය. රාජ්‍ය සේවය තුළ නවීනත්වය, තාක්ෂණ භාවිතය, බාහිර සහ අභ්‍යන්තර පාරිභෝගික සත්කාරය, වැඩ සරල කිරීම පිළිබඳ සහ බාහිර ආයතන සමග සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමට මුල්තැන දෙමින් 2013 - 2014 වසර තුළ ක්‍රියාත්මක කරන ලද සුවිශේෂී වැඩසටහන් පිළිබඳව ඇගයීමට ලක් කරමින්, මෙම සම්මානය දෙපාරත්මේන්තුව වෙත පිරිනමා ඇත.

කෙටි කලකින් සුවිසල් ප්‍රගතියක් අත්පත් කරගත් රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස සෙසු සියලු රාජ්‍ය ආයතනයන්ට පූර්වාදර්ශ සපයමින් ආයතනික ව්‍යුහයන් ප්‍රතිනිර්මාණය කර ගනිමින් විශ්‍රාමික ප්‍රජාවට කඩිනම් හා කාර්යක්ෂම සේවයක් සැපයීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ප්‍රමුඛ අපේක්ෂාව විය. 2014 වර්ෂය වෙනුවෙන් ඵලදායීතා ජයග්‍රහණය ලැබුවද, 2014 සිට 2015 දක්වා දෙපාර්තමේන්තු සේවාලාභී සත්කාරය සහ රාජ්‍ය සේවා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා නවීන තාක්ෂණය භාවිතා කරමින් සිදුකරන සේවා නොනවත්වා ඉදිරියට ගෙන යන බව මෙහිලා සඳහන් කළ යුතු ය.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 14. නිලධාරී සුබසාධනය සහ අභිවෘද්ධිය වෙනුවෙන් කැපවීම.

විශ්‍රාමික ප්‍රජාව වෙත සේවා සැපයීමේදී අභ්‍යන්තර සේවාලාභීන් ලෙස ප්‍රධාන කාර්යාලයේ ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ද සේවය කරනු ලබන දහසකට ආසන්න නිලධාරීන්ගේ දායකත්වය මේ අවස්ථාවේදී ප්‍රශංසනාත්මකව අගය කළ යුතු ය.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි සේවය ලබා ගැනීමට පැමිණෙන්නේ විශ්‍රාම ලැබූ තවත් රාජ්‍ය සේවකයකු හෝ රාජ්‍ය සේවකයකුගෙන් යැපෙන්නකු වන බැවින්, ඔවුන්ට සේවා සැපයීමේදී ආයතනික නිලධාරීන්ගේ කැපවීම, විෂය පද්ධතිය පිළිබඳ දැනුම අතිශය වැදගත් වන අතර, එකී නිපුණත්වයන්ගෙන් පිරිපුන් සේවක කාර්ය මණ්ඩලයක් සිටීම ද මෙම වසර තුළ ලබාගත් ජයග්‍රහණයන්ට හේතු පාදක විය.

එවන් මනා නිපුණත්වයකින් යුතු කාර්ය මණ්ඩලයක් වෙත සේවා සැලසීමට අවශ්‍ය ආහාර සේවා, පරිසරය, සනීපාරක්ෂක පද්ධතිය, කාන්තා විවේකාගාර ස්ථාපිත කිරීම ද සිදුකරන ලදී. එසේම ඔවුන්ගේ නිපුණතා එළිදක්වන බිත්ති පුවත්පතක් ඇරඹීම, අනාගත අභිවෘද්ධිය සලසාලන කුසලතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, සෑම සිකුරාදාවකම දැනුම් කළමනාකරණ වැඩසටහන් සංවිධානය කිරීම, විදේශ සංචාර වැනි වැඩසටහන් ඔස්සේ නිලධාරී සුබසාධනය ප්‍රශංසනාත්මකව සිදුකිරීමට හැකි විය.

අවුරුදු උත්සව ආදී වෙනත් උත්සව අවස්ථාවන් ඔස්සේ ආයතනික සේවකයන්ගේ දූ දරුවන් හා පවුලේ සාමාජිකයන් සමඟ ද සබඳතා ගොඩනැංවීම මඟින් මානසික තෘප්තිය තහවුරු කිරීමට කටයුතු කිරීමෙන් සේවක සුබසිද්ධිය අර්ථවත් කර ඇත.

එමෙන් ම සුබසාධන සංගමය නැවත ශක්තිමත් කිරීම තුළින් සුබසාධන කටයුතු නැවත පවත්වාගෙන යාමේ යාන්ත්‍රණය ශක්තිමත් කර ඇත.

රාජ්‍ය සේවාවේ මෑතකාලීන ප්‍රවණතාව වන්නේ කාන්තා නිලධාරීන්ගේ සංඛ්‍යාව ඉහළයාමයි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ මෙම සාධකය විශාල ලෙස කැපී පෙනෙන අතර, එම නිලධාරිනියන්ගේ ආරක්ෂාව හා කාන්තාවන්ට ඇතිවන කායික හා මානසික අනනුකූලතාවන්ට ප්‍රතිකාර ගැනීමට පුද්ගලිකත්වය ආරක්ෂා වනපරිදි විවේකාගාරයක් සෑදීම රාජ්‍ය සේවයට නව අරුතක් එක් කරන්නකි.

### 14.1 භෝජනාගාරය නවීකරණය කිරීම

අභ්‍යන්තර සේවාලාභීන්ගේ සේවා පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ සාධාරණ මිලක් හා සෞඛ්‍ය සම්පන්නභාවය තහවුරු කරමින් දෙපාර්තමේන්තුවෙහි භෝජනාගාරය නවීකරණයට මේ වසරේ දී හැකියාව ලැබුණි. සෞඛ්‍ය නියාමයන්ට යටත්ව සේවා සපයන ආයතනයකට මේ වසරේ ද භෝජනාගාරය මෙහෙයවීමේ කටයුතු භාරදුන් අතර, එමගින් සේවකයන්ගේ තෘප්තිය ඇති කිරීම හා වැඩකිරීමේ රුචිකත්වය වර්ධනය කිරීමට අවස්ථාව සැලසුණි.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

වෙනත් රාජ්‍ය ආයතනයන්ට සාපේක්ෂව මෙම භෝජනාගාරය වෙනස් පද්ධතියක් ලෙස ගොඩනඟා ඇති අතර, භෝජනාගාරයේ අභ්‍යන්තර පිරිසිදුකම, කාර්ය මණ්ඩලයේ පිරිසිදුකම හා ආහාරවර්ගවල පිරිසිදුකම සහතික කිරීමට මේ වනවිටත් කටයුතු කර ඇත.

එමෙන් ම, රජයේ වෙනත් ආයතනයන්ට වඩා වෙනස් Business Model ආකාරයට භෝජනාගාරයේ නඩත්තු කටයුතු කරන අතර, සාධාරණ කුලියක් අය කරගැනීමට කටයුතු කරමින් ජාතික ආදායමට යම් දායකත්වයක් ලබාදීමට ද කටයුතු කර ඇත.

### 14.2 කාන්තා විවේකාගාරය

දෙපාර්තමේන්තුවෙහි වැඩ කරන අභ්‍යන්තර කාර්ය මණ්ඩලයෙන් 90% කට ආසන්න ප්‍රමාණයක් කාන්තාවන් වන අතර ඔවුන්ගේ ආරක්ෂාව හා පෞද්ගලිකත්වය ආරක්ෂා වන අයුරින් අවශ්‍ය අවස්ථා වල දී විවේක ගැනීම සඳහා කාන්තා විවේකාගාරයක් ආරම්භ කිරීම සිදු විය. අභ්‍යන්තර පාරිභෝගිකයා රැක ගැනීමට නව කළමනාකරණ ක්‍රම උපයුක්ත කර ගනිමින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතිකරණය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම රාජ්‍ය සේවය මේ වනවිට ආරම්භ කර ඇති බව මෙමගින් සහතික කර ඇත.

ස්ත්‍රියක් ලෙස සිය භෞතික පැවැත්මේදී ඇතිවන මානසික හා කායික අවශ්‍යතාවන්ට පහසු වනපරිදි පෞද්ගලිකත්වය ආරක්ෂා වන සේ සනීපාරක්ෂාව පහසු කර ගැනීමට හැකිවන අයුරින් කටයුතු සලසා ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී වෛද්‍යවරයකු කැඳවීමට පහසුකම් සලසා තිබේ.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

### 14.3 බක්මහ උළෙල පැවැත්වීම

බක්මහ උළෙලක් තුළින් සාම්ප්‍රදායිකව අපේක්ෂා කරනු ලබන අරමුණුවලින් ඔබ්බට ගොස් සුවිශේෂී වූ අරමුණු රැසක් ඉලක්ක කර ගනිමින් මෙවර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු බක්මහ උළෙල සංවිධානය විය. ඒ අතුරින් ප්‍රමුඛ අරමුණක් වූයේ පෞද්ගලික හා රාජ්‍ය අංශයේ නිලධාරීන්, විශ්‍රාමික ප්‍රජාව, කලා ශිල්පීන්, මාධ්‍යවේදීන්, ආයතනික නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල අයවළුන් දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළදී හමුවීම ඔස්සේ අන්‍යෝන්‍ය සබඳතාව වර්ධනය කරගැනීම යි.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

මෙහිදී ජන ක්‍රීඩා සහ ජනශ්‍රැති ආශ්‍රිත දැනුම යාවත්කාලීන කරමින් විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක විණි. පොලිස් නිල සුනඛ සංදර්ශනය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද ගමගෙදර, විශ්‍රාමික ගුවන් විදුලි ශිල්පීන් විසින් ඉදිරිපත් කරන ලද වැඩසටහන්, සිබිල් වෙත්තසිංහයන් කුඩා දරුවන් වෙනුවෙන් මෙහෙයවන ලද චිත්‍ර වැඩසටහන, හමුදා තූර්ය වාදක කණ්ඩායමේ ගායන වාදන හා නර්තන සහ ජනප්‍රිය කලා ශිල්පීන් විසින් මෙහෙයවන ලද වැඩසටහන් මේ අතර කැපී පෙනිණ.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 15. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගීතාව

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර වැඩ පරිසරය සැකසීමේදී හා බාහිර සේවාලාභී සම්බන්ධතා අංශ වැඩිදියුණු කිරීමේදී පුද්ගලික අංශයේ සුවිසල් දායකත්වයක් ලබාගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකිවිය.

මෙමගින් රජයේ අවම මූල්‍ය දායකත්වයක් තුළින් සේවාලාභීන්ට අවශ්‍ය වැඩ පරිසරයක් සැකසීමට හැකි වූ අතර, විශ්‍රාමිකයන් වෙත සලසන සේවාවන් පිළිබඳ ප්‍රචාරණයන් අවස්ථාවන් සිදුකිරීමට හැකිවීම පසුගිය වසරේ සිදු වූ සුවිශේෂී ක්‍රියාවලියකි.

මේ යටතේ ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය, සණස සංවර්ධන බැංකුව, පැන් ඒෂියා බැංකුව, එට්සලාට් ආයතනය, මරීනා ආයතනය, එල් බී ෆිනෑන්ස් ආයතනය, හැටන් නැෂනල් බැංකුව සහ ඩයලොග් ආයතනය වැනි ආයතනයන්ගේ දායකත්වය ලබා ගන්නා ලදී. මෙමගින් රාජ්‍ය සේවය තුළ පුද්ගලික හා රාජ්‍ය අංශයන්ගේ ප්‍රවර්ධනය සඳහා සේවා පද්ධතීන් ඉහළ නැංවීමට කාර්යක්ෂම සේවාවක් සැපයිය හැකි බව සනාථ කරන ලදී.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 16. පුද්ගලික අංශයේ දායකත්වය

විශ්‍රාම වැටුපෙන් ඔබ්බට ගොස් විශ්‍රාමිකයාට දැවැන්ත සේවාවක් සැපයීම වසර 2014 දී සිදු කරන ලදී. එය තවදුරටත් තීව්‍රකරමින් පුද්ගලික අංශයේ විශාල ආයෝජන සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුව තුළ සිදු කිරීමට 2015 දී හැකි විය. ඔවුන්ගේ දායකත්වය ඇතිව විශ්‍රාමිකයාට සේවා සැපයීම සඳහා අවබෝධතා ගිවිසුම් රැසක් අත්සන් තබා ඇති අතර, විශ්‍රාමිකයාට ලබා දී ඇති Visa කාඩ්පත හරහා පුද්ගලික රෝහල්, ෆාමසි සහ වෙළඳ ආයතනවලින් වට්ටම් හා විශේෂ මිළගණන් යටතේ සේවා සැපයීමට ද හැකිවිය.

මෙම පුද්ගලික ආයතනයන්ගේ සහාය ඇතිව දෙපාර්තමේන්තු බාහිර පරිසරය සැකසීම, අලංකරණය මෙන් ම, විශ්‍රාම වැටුප් දිනය සඳහා ඔවුන් ලබාදුන් සුවිසල් දායකත්වය ද රාජ්‍ය ආයතනයක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පුද්ගලික අංශය සමග පවතින සුහදත්වය තහවුරු කිරීමකි.

මෙම වසරේදී පුද්ගලික ආයතන ඒකරාශී කර ව්‍යාපාරික වැඩමුළුවක් (business forum) පැවැත්වීමට දෙපාර්තමේන්තුවට හැකිවීම නව රාජ්‍ය පරිපාලන කළමනාකරණයේ ජාලගතවීමේ (networking) ප්‍රගුණත්වය ප්‍රකට කරයි.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

මෙහිදී පසුගිය වසර දෙක තුළ දෙපාර්තමේන්තු අභිවෘද්ධිය සඳහා දායක වූ පුද්ගලික අංශයේ ව්‍යාපාරිකයන් ඇගයීමට ලක් කරන ලද අතර, දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය සේවය පිළිබඳ ඔවුන්ගේ ආකල්ප වෙනස් කළ බව දන්වන්නේ සතුටිනි.

## 17. ගොඩනැගිලි භාවිතය හරහා ජාතික ආදායමට ලබා දුන් දායකත්වය

දෙපාර්තමේන්තුව පරිපාලනය කරනු ලබන ගොඩනැගිලි සංකීර්ණයේ වර්ග අඩි 56,800 ප්‍රමාණයෙන් භාවිතයට නොගන්නා වර්ග අඩි 89,600 ක ප්‍රමාණයක් භාවිතයට ගැනීමට මෙම වසර තුළ හැකිවිය.




මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

විශේෂයෙන් ම රාජ්‍ය ආයතනවලට රජයේ තක්සේරු අනුව බදුදීමෙන් අමතර ආදායමක් රජයට ලබාදීමට හැකි වූ අතර, ගොඩනැගිලි භාවිතය ඉහළ නැංවීමෙන් දෙපාර්තමේන්තුවේ සේවක කාර්ය මණ්ඩලයටත්, දෙපාර්තමේන්තුවට පැමිණෙන විශ්‍රාමික ප්‍රජාවටත්, විශේෂයෙන් මෙම සංකීර්ණය අවට පදිංචි ජනතාවටත් අමතර සේවාවන් සැපයීමට මෙමගින් හැකිවීම 2015 වසරේ දී ලද විශේෂ ජයග්‍රහණයකි.

ප්‍රස්තාර 30




වගුව 30

| ස්ථානය | මුදල රු. |
|---|---|
| ආයුර්වේද ඖෂධ සංස්ථාව | 200000 |
| හයිලන්ඩ් කිරිහල | 94500 |
| සම්පත් බැංකුව A T M | 240000 |
| හැටන් නැෂනල් බැංකුව | 198000 |
| හැටන් නැෂනල් බැංකුව ATM | 120000 |
| රා.සේ.වි.හා. අරමුදල | 120000 |
| ප්‍රා. සෞ.සේවා අ. කාර්යාලය | 2565000 |
| ලංකා හොස්පිට්ල් (පුද්) සමාගම | 3000010 |
| පේ. දෙපාර්තමේන්තුව | 1457950.8 |
| මෝ. රථ ප්‍ර. ප. කො. කාර්යාලය | 780000 |
| ආපන ශාලාව | 12000 |
| ප.ඉ. කො. දෙපාර්තමේන්තුව (බ.ප.) | 3000000 |
| සෞ. සේ. අ. කාර්යාලය (බ.ප.) | 346500 |
| ප්‍රා. සෞ.සේවා අ. කාර්යාලය ii කොටස | 455000 |

මූලාශ්‍රය - පාලන අංශය

(මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ලංකා හොස්පිට්ල් ආයතනය, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, පේෂකර්ම දෙපාර්තමේන්තුව,මීට අමතරව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුවේ ATM මුදල් පරිහරණ යන්ත්‍ර පිහිටුවීමෙන් සේවාලාභීන්ට සේවාවන් සපයන අතර ම, දෙපාර්තමේන්තුවට ආදායමක් ලබාගැනීමට ද හැකිවිය.

## 18. තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක් බිහි කිරීම.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යය වන විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය හා එම ක්‍රියාවලිය කළමනාකරණයෙන් ඔබ්බට විශ්‍රාමික ප්‍රජාව තෘප්තිමත් කිරීම වෙනුවෙන් සේවාවන් රාශියක් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. වෙදමුල්ල කැලණිය සහ රම්බොඩ නිවාඩු නිකේතනයන් තවදුරටත් වැඩිදියුණු කිරීම ආරම්භ ලද්දේ එහි එක් පියවරක් වශයෙනි. එහිදී විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් ප්‍රශංසනීය සේවාවක් සැපයීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන ලදී. වෙදමුල්ල නිවාඩු නිකේතනයේ ශ්‍රවණාගාරය වැඩි දියුණු කිරීම, නවීන සනීපාරක්ෂක පද්ධතියක් ඇති කිරීම සහ නවීන ගෘහ උපකරණ ලබා දෙමින් නේවාසික පහසුකම් වැඩි දියුණු කිරීම මෙහිදී සිදු විය. මෙම නිවාඩු නිකේතනයන්ගෙන් මෙම වසර තුළ ලැබුණු වාර්තාගත ආදායම මගින් ජාතික ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හැකිවිය.

කැලණිය නිවාඩු නිකේතනයේ මුළුතැන්ගෙය නවීකරණය කිරීම තුළින් මෙම මධ්‍යස්ථානය විශ්‍රාමික ප්‍රජාවගේ සෑම අවශ්‍යතාවයක් වෙනුවෙන් ම කැපවීමෙන් සේවා සපයන මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීමට මේ වනවිටත් කටයුතු කර ඇත. තවද රාජ්‍ය ආයතනයන්හි විවිධ පුහුණු වැඩසටහන් සඳහා කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය ලබාදී අමතර ආදායම් මාර්ග නිර්මාණය කර ගැනීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබේ.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

රම්බොඩ නිවාඩු නිකේතනය සීඝ්‍රයෙන් ජනප්‍රිය වෙමින් පවතින අතර කොළඹින් බැහැර ගමන් වලදී මෙය භාවිත කිරීම විශ්‍රාමිකයන් අතර දැනටමත් ප්‍රචලිත වී ඇත.මෙම නිවාඩු නිකේතන වැඩිදියුණු කිරීම තුළින් රජයට ඉහළ ආදායමක් උත්පාදනය කර දීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකිවී ඇත. තවද රම්බොඩ නිවාඩු නිකේතනය හරහා එම ප්‍රදේශයේ ජනතාවට රැකියා උත්පාදනය කරමින් ආදායම් මාර්ග වර්ධනය කර දීමට ද රටේ සංවර්ධන ක්‍රියාදාමයට දායකත්වයක් සැපයීමට ද අවස්ථාව ලැබිණි.

| නිවාඩු නිකේතනය | ආදායම 2015 වර්ෂය |
|---|---|
| කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය | 3,915,475.00 |
| රම්බොඩ නිවාඩු නිකේතනය | 565,440.00 |

මූලාශ්‍රය - ගිණුම් අංශය



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 19. මානව සම්පත ප්‍රතිසංවිධානය කිරීම.

දෙපාර්තමේන්තු සමස්ත කාර්ය මණ්ඩලය 1017කි. මෙම කාලය තුළ තනතුරු හා වගකීම බෙදී ගිය ද, සමස්ත මානව සම්පතෙහි අගය ගත් කළ දෙපාර්තමේන්තු ක්‍රියාවලියේ කාර්ය සාධනය සාර්ථක කර ගැනීමට සෘජුව ඉවහල් වී තිබේ. ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් ජාලය තාක්ෂණික වශයෙන් සම්බන්ධ වුවද, එම ජාලය මෙහෙයවන මානව සම්පතෙහි ගුණාත්මක බව මෙම ක්‍රියාවලිය තවදුරටත් සාර්ථක කරන ලදී.

චක්‍රලේඛ අංක 6/2006ට අනුව විශ්‍රාම වැටුප් ගැලපීමේදී අභ්‍යන්තර මෙන්ම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් එහි නායකත්වයේ මඟපෙන්වීම යටතේ හා ඉලක්ක ළඟාකාර ගැනීමට කැපවූ ආකාරය ප්‍රශංසනීය ය. මෙම වසර තුළ මානව සම්පත් ශේෂ පත්‍රය සමබර වීමට පහත සඳහන් නිලධාරීන්දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරගත් අතර,

දෙපාර්තමේන්තුව පහත සඳහන් නිලධාරීන් බැහැරට යැවීමට කටයුතු කර ඇත.

**ප්‍රස්තාර 31**




**වගුව 31**

| නිලධාරීන් | ස්ථාන මාරුවීම් |
|---|---|
| රාජ්‍ය කළමනාකාර සහකාර | 57 |
| ලේඛන සහකාර | 26 |
| සංවර්ධන නිලධාරි | 20 |
| කාර්යාල කාර්ය සේවය | 18 |
| මාණ්ඩලික නිලධාරි | 1 |

මූලාශ්‍රය - පාලන අංශය

වසර 2013 අවසානයේ සිට දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක නොවූ ස්ථාන මාරුවීම් සඳහා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කෙරෙන අතර, වාර්ෂික මානව සම්පත විවිධ කුසලතා අත්පත් කරගත හැකිවන අයුරින් (Job rotation) ස්ථානගත කිරීමට කටයුතු කරන ලදී. ආයතනයේ අනාගත අභියෝග සඳහා මානව සම්පත සංවිධානය කිරීමටත් කටයුතු කර ඇත.

**ප්‍රස්තාර 32**




**වගුව 32**

| නිලධාරීන් | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | 8 | 13 |
| විශ්‍රාම වැටුප් නිලධාරි | 64 | 18 |
| සංවර්ධන නිලධාරි | 47 | 16 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 97 | 16 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 00 | 1 |
| ලේඛන සහකාර | 24 | 02 |
| කාර්යාල කාර්ය සහයක | 15 | 32 |
| රියදුරු | 00 | 11 |

මූලාශ්‍රය - පාලන අංශය

## 19.1 පුහුණු ක්‍රියාවලිය විධිමත් කිරීම

නිරන්තරයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මානව සම්පත ගුණාත්මක කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ 2014 වසරේ සිට නිලධාරීන්ට දේශීය වශයෙන් මෙන් ම, විදේශීය වශයෙන් ද පුහුණුවීම් හා අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මේ අනුව දෙපාර්තමේන්තු මානව සම්පත කාලෝචිත අවස්ථාවන්ට ගැලපෙන විවිධ කුසලතා හා විවිධ ආකල්පවලින් පිරි මානව සම්පතක් වන අතර, ඔවුන් දෙපාර්තමේන්තුවේ සිදුවන පරිවර්තනයන් සඳහා ක්ෂණිකව ස්ථානගත කරගත හැකි කණ්ඩායම් බවට පත්ව ඇත. මෙමගින් රාජ්‍ය සේවාවේ සිදුවන තාක්ෂණික වෙනස්කම් සමග නව රාජ්‍ය සේවයක කොටස්කරුවන් බවට පත්වීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හැකි වී ඇත.

**ප්‍රස්තාර 33**




**වගුව 33**

| ස්ථානය | ප්‍රමාණය |
|---|---|
| ජාතික තරුණ සේවා සභාව | 36 |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 29 |
| ටෙක් ශ්‍රී ලංකා | 1 |
| ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය | 1 |
| විශ්ව විද්‍යාල | 11 |
| ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | 5 |

මූලාශ්‍රය - පාලන අංශය

## 19.2 බාහිර පුහුණු

විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය යනු සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධාන විෂයයක් වන අතර, මෙය ආයතනයක මානව සම්පත් කළමනාකරණයේ අවසාන කාර්යභාරය වේ. ඒ අනුව සියලුම රාජ්‍ය ආයතන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා බද්ධව ක්‍රියාත්මක වනු ලබයි.

ඒ අනුව විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය පිළිබඳ එම ආයතන කාර්ය මණ්ඩල දැනුවත් කිරීමත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සීඝ්‍රයෙන් වෙනස්වන විශ්‍රාම වැටුප් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ එම ආයතනවලට දැනුම්වත්භාවය ලබාගැනීමට අදාළ ආයතනවල ඉල්ලීම් හා අවශ්‍යතාවයන් අනුව විශේෂ වැඩසටහන්, දේශන හා වැඩමුළු රාශියක් මෙම වසර තුළ පවත්වන ලදී.






මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

## 19.3 අභ්‍යන්තර පුහුණු

මානව සම්පත් සංවර්ධනයේ දී සමාජ සත්කාර සේවයට ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අවධානය යොමු කරන ලදී.මේ අනුව රජය යටතේ පාලනය වන විවිධ පුහුණු ආයතන සහ රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාලයන්හි විද්‍යාර්ථීන්ට අවැසි ප්‍රායෝගික පුහුණුව හා වර්ධනයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සුවිසල් මෙහෙයක් ලබා දෙමින් සිටී.

මේ යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනය,ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය,කාර්මික තාක්ෂණ ආයතනය,රාජ්‍ය විශ්ව විද්‍යාල ආදියෙහි 1500ක් පමණ විද්‍යාර්ථීන්ට පුහුණු අවස්ථා ලබා දෙන ලදී. මෙම පුහුණු කාල සීමාව තුළ ප්‍රායෝගික පුහුණුවට අමතරව ඇඩි සුපරීක්ෂාකාරීත්වය යටතේ ඔවුන්ගේ මෘදු කුසලතා වර්ධනයට ද අවස්ථාව සලසන ලදී.

ප්‍රස්තාර 34

පුහුණු පාඨමාලා - 2015




වගුව 34

| පුහුණු | ප්‍රමාණය |
|---|---|
| අභ්‍යන්තර නිලධාරීන්ගේ පුහුණු | 72 |
| බාහිර නිලධාරීන්ට ලබා දුන් පුහුණු | 48 |
| විදේශ පුහුණු | 25 |

මූලාශ්‍රය - පාලන අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ සිදු වූ පරිගණක තාක්ෂණ ආයතනයේ පුහුණුවන්නන්ගෙන් ලැබුණු පිටිවහල අති මහත් ය.දෙපාර්තමේන්තුවෙහි පුහුණුව ලද පිරිස් වර්තමානය වන විට බාහිර වැඩ ලෝකයෙහි ඉහළ රැකියාවන්හි නිරත වන අතර අප ආයතනයෙන් ලද පුහුණුව ඔවුහු නිරතුරුව පැසසුමට ලක් කරති.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය පුහුණුවීම් පිළිබඳ ලබාගත් පසු විපරම් වැඩසටහන්වලදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳ ඔවුන්ගේ සුබවාදී අදහස් ලබා දුන් අතර ඔවුන්ගේ විශේෂඥ කණ්ඩායමක් දෙපාර්තමේන්තුව නිරීක්ෂණය කර ඒ බව සනාථ කරන ලදී.



මූලාශ්‍රය - මාධ්‍ය ඒකකය

